භක්ති ප්‍රබෝධනය

පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2025 මැයි - ජූනි | 126 වන කාණ්ඩය - 03 කලාපය | පිටු 32 | DOP/NEWS/02/2025



## ඥාන පාත්‍රෙන්

ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

# කිරි අම්මාවරු දනට වඩිනවා

ගී පද - හෙක්ටර් විජේසිරි
තනු නිර්මාණය - රෝහණ වීරසිංහ
ගායනය - චන්ද්‍රලේඛා පෙරේරා



කිරි අම්මාවරු දනට වඩිනවා
කිරි සුවඳයි මුළු ගම්මානේ
අම්මා ඇයි ඒ දනට නොයන්නේ
නොඅසන් පුතනුවනේ
මා සිත රිදෙන නිසා

නෙත නිදි වරමින් කැත කුණු අත ගා
මම නුඹ හැදුවෙමි දුක් විඳලා
එනමුදු කුසයේ හොවමින් බිහිකර
ඇඟ ලේ කිරිකර නැත පොවලා

නුඹගෙන් දරු සුරතල් බැලුවා මිස
මව් පදවිය නැත මා පතලා
මතු බවයේ මා දනට වඩින්නම්
නුඹ බිහි කර කිරි මව වීලා

හෙක්ටර් විජේසිරි පද රචකයාණන්ගේ සුරතින් රචිත, රෝහණ වීරසිංහ සංගීතයෙන් හැඩගැන්වී, චන්ද්‍රලේඛා පෙරේරාගේ මියුරු හඬින් ගැයෙන "කිරි අම්මාවරු දනට වඩිනවා" ගීතය අර්ථ දැක්විය හැක්කේ ඉතා සංවේදී, භාවාත්මක නිර්මාණයක් ලෙසිනි. උත්තරීතරම මව් පදවියට ශරීරයෙන් උරුමකම් නොකීවත්, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මවක් වූ, දිරිය කතකගේ කඳුළු කතාව එම ගීතයට ප්‍රස්තුතය වී තිබේ.

කිරි මවක් ලෙස හඳුන්වන්නේ තම දරුවා හට සිය පයෝධරයෙන් කිරි පොවනා අම්මා කෙනෙකුය. කිරි අම්මාවරුන්ට පිදෙන දානය යනු බොදුනු-හින්දු ආගමික පසුබිමක් සහිත සිරිලක ඉපැරණි චාරිත්‍රයකි. මෙම ගීතයට අනුව, මුළු ගම්මානය පුරාම කිරි සුවඳ හමා යන්නේ ඒ දානයට වැඩම කරන මව්වරුන් නිසා ය. එම දසුන දෙස බලා සිටින සුරතල් පුතු, ඉන් ඉක්බිති සිය 'අම්මා' දෙසද හැරී බලන්නට ඇති. ඇය ඒ බැල්ම වටහා ගන්නේ පුතු විසින් අසන පැනයක් ලෙසිනි: "ඇයි මගේ අම්මා ඒ දානයට නොයන්නේ?" මුළු ගීතයම වනාහී එම ප්‍රශ්නයට ඔහුගේ 'අම්මා' විසින් ලබා දෙන පිළිතුරයි.

"නෙත නිදි වරමින්, කැත කුණු අත ගා, දුක් විඳිමින්" තමන්ව හැදූ වැඩූ ඇයව, මේ අනත් දරුවා සළකන්නේ සිය මව ලෙසිනි. සැබවින්ම, කුසින් නොවැදුව ද, ඈ හදින් මවක වී අවසාන ය. කිරි වෙනුවට මව් සෙනෙහස ඈ වෙතින් ගලා යයි. එහෙත්, සමාජයට අනුව ඇය මවක් නොවේ. මේ සමාජ හංවඩුව නිසා මේ මව දිනපතා කෙතරම් පීඩාවට පත්වනවා ඇත්ද? කිරි මවුනගේ දානයට නොවඩින්නේ ඇයිදැයි නොඅසන ලෙසට සිය දරුවාට ඈ ආයාචනා කරන්නේ ඒ චිත්ත වේදනාව නිසාමය.

දස මස උසුලා, ප්‍රසූත වේදනාව දරා ලොවට බිළිඳෙකු බිහිකිරීම කිසිවිටෙක අවතක්සේරු කළ නොහැක. එසේ නමුදු, දරුවෙකු වැදූ පමණින්ම කෙනෙකු මාතෘත්වය නමැති උත්තරීතර පදවියට සාධාරණයක් ඉටුකළ බැව් කිව හැකිද? බිළින්දන් කුණු ගොඩවලට, ගංගාවලට, කාණු පල්ලට විසි කරන්නේ ආර්ථික හෝ සමාජීය ගැටළු නිසා බැව් පවසමින් එය සාධාරණීය කිරීමට අපට හැකිද? සමාජය විසින් "වඳ" ලේබලය ඇළවූවත් අසරණ බිළිඳෙකුට මවකගේ රැකවරණය සදන දිරිය ගැහැණියක් ඊට වඩා ශ්‍රේෂ්ට නොවේ ද? මේ ගීතය ගයන්නේද එවැන්නිය කි. "නුඹගෙන් දරු සුරතල් බැලුවා මිස මව් පදවිය නැත මා පතලා..." එකී ගැහැණිය ඒ දරුවාගෙන් සෑහිමකට පත් වූ අයුරු අති සංවේදීය. අනුන්ගේ දරුවෙකුට වුව, දිවි හිමියෙන්ම ආදරය දුන් නිසා ඈ සැනසෙන්නීය. ඒ සැනසීම ඇයට බලාපොරොත්තුවක් ගෙන දේ. "මතු බවයේ මා දනට වඩින්නම් නුඹ බිහි කර කිරි මව වීලා" ඒ අධිෂ්ඨානශීලී, අකම්පිත, බලාපොරොත්තුවේ පැතුමයි.

සමස්ත ගීතයම "අම්මා" යන සංකල්පය දෙස තෙවැනි ඇසකින් බලන්නට අපව යොමු කරවයි. මාතෘත්වය පුදන්නට දරුවෙකු වැදූ පමණින් බැරි බවත් දරුවෙකු නොවදාම මවක් වෙන්නට උතුම් හදවතක් ඇති ගැහැණියකට හැකි බව පෙන්වීමට සුරචිත "කිරිඅම්මාවරු" ගීය එදත් අදත් එක සේ ආදරයට ලක් වන්නේ එබැවිනි.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2025 මැයි - ජූනි**


**ප්‍රකාශනය**
නිර්මල මරිය නිකාය

**භාරකරු**
අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**
ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

**කවරය නිර්මාණය**
අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**
නිලුම්ණ හර්ෂාන්

**මුද්‍රණය**
එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණෙනි ...

4 හෙළිදරව්ව

6 'ඥාන පාත්‍රෙනි' යනු කුමක් ද ?
මලින්ත බෝපෙආරච්චි

7 අම්මේ ආදර අම්මේ - දිල්ශාන් මධුරංග

8 අතීතයේ මතකයන් ... - K. G. රනිදි මින්දුලා

9 'ඥාන පාත්‍රෙනි' ... - තීක්ෂණ පෙරේරා

10 ලිවීම හා කියවීම ... - මහින්ද නාමල්

12 අපේ මැණියෝ - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු
නිමල මවුනි - සී. ආර්. ඩික්සන් ඇන්ටනී

13 ලේඛන කලාව - සපුගස්කන්දේ රංජිත්

14 මරණය පෙනි පෙනී ... - සංජීවන් ගුණතිලක

15 කුරුසිය පාමුල ... - කැලිස්ටස් ජයමාන්න

16 කෙටි කතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

18 ශුද්ධවූ ජපමාලයේ හා කාර්මෙල් සළුදාතුවේ ...
සී. ආර්. ඩික්සන් ඇන්ටනී

20 දෙවියන් වෙනුවෙන් ... - මාක් ජයමාන්න

21 ලස්සන ජීවිතයක් - පස්කල් ජයමාන්න

22 **Twisted Wisdom in Modern Society**
K. C. Grero

24 ඕං එහෙනං - සූරිය මාමා

25 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 85
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා

28 ප්‍රහේලිකා අංක 83 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළ වන
ඉපැරණි ම සිංහල සඟරාව යි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළ වන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

දේව මාතාවන් වහන්සේගේ ප්‍රාර්ථනාවේ සටහන් වී ඇති යැදුමකි; 'ඥාන පාත්‍රෙනි'. මෙයින් අදහස් කරන්නේ මරියෝත්තමාවන් දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්ම ක්‍රියාත්මක කරන්නට ඊට ප්‍රතිචාර දැක්වීමේ දී ඥානවන්තව දේව වචනයට අවනත වූ ආකාරය යි. එතුමියගේ ඥානවන්ත ප්‍රතිචාරය දෙවියන් වහන්සේගෙන් ම ලැබුණු ප්‍රඥාවකි. පාත්‍රයකට යම්කිසි දෙයක් දැමිය හැකි ය. එතුමිය සතු වූ දේව ප්‍රඥාව පාත්‍රයක තිබෙන්නා සේ ප්‍රාර්ථනාවේ උපමා කර ඇත. කවරයේ පෙන්නුම් කරන දැල්වෙන පහන මරියාවන්ගේ ඥානය සංකේතවත් කරයි.

**ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා**


## භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)
දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

## BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)
Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණෙනි, ඔබ වහන්සේට සග සුව පතමු



ලෝකයේ කොතැනක මනුෂ්‍යත්වයට විරුද්ධව කටයුත්තක් සිද්ධ වූව ද අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් ඊට එරෙහිව හඬ අවදි කළ ආධ්‍යාත්මික දැවැන්ත යුග පුරුෂයෙකි. කතෝලික ජනතාවගේ විශ්ව එඬේරාණන් වූ ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් ක්‍රිස්තු ප්‍රතිපත්ති, වටිනාකම් තම වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද ආදර්ශයක් දෙමින් ජනතාව අතර කළ දූත මෙහෙවර අසමසම ය. දුප්පත් ජනතාවට, සංක්‍රමණිකයන්ට, අවතැන් වූවන්ට, සරණාගතයන්ට, සමාජයේ කොන් කරන විවිධ කණ්ඩායම්වලට උන් වහන්සේගේ හදවතේ අප්‍රමාණ ප්‍රේමයක් තිබුණි.

කිතුනුවන් තුළ තිබිය යුතු අනිවාර්ය ලක්ෂණයක් ලෙස ෆ්‍රැන්සිස් පාප්වහන්සේ "**බලාපොරොත්තුව**" නමැති ගුණය උන් වහන්සේගේ පළමු නිල ලේඛනය හරහා මතු කරයි.

"බලාපොරොත්තුව යනු කුමක්දැයි කවුරුත් දනිති. අනාගතය කුමක් ගෙන එයිදැයි අප නොදැන සිටිය ද, සෑම පුද්ගලයෙකුගේ ම හදවතේ, යහපත් දේ පැමිණේවා යන ආශාව සහ අපේක්ෂාව ලෙස බලාපොරොත්තුව පවතී. එසේ වුව ද, අනාගතය පිළිබඳ අවිනිශ්චිතභාවය සමහර විට විශ්වසනීය බලාපොරොත්තුවේ සිට කනස්සල්ල දක්වා, සන්සුන් භාවයේ සිට නොසන්සුන් කනස්සල්ල දක්වා, දැඩි විශ්වාසයේ සිට පැකිළීම සහ සැක කිරීම දක්වා පරාසයක විහිදෙන පරස්පර හැඟීම් ඇති කළ හැකි ය. කිසිවකට ඔවුන්ට ප්‍රීතිය ගෙන දිය නො හැකි සේ, අනාගතය ගැන අධෛර්යවත් වූ, අසුභවාදී පුද්ගලයින් අපට බොහෝ විට හමු වේ. අප සැමට ම, ජුබිලි වසර බලාපොරොත්තුවෙන් අලුත් වීමට අවස්ථාවක් වනු ඇත. එම බලාපොරොත්තුව සඳහා හේතු සේවීමට දේව වචනය අපට උපකාර කරයි." **(Spes Non Confundit - බලාපොරොත්තුව අපව අත්නොහරියි)**

ක්‍රි.ව. 2025 ජුබිලි වර්ෂයක් ලෙස ප්‍රකාශ කරමින් "බලාපොරොත්තුවේ වන්දනා කරුවන් වීමට" විශ්වාසකයන්ට ආරාධනා කරමින් මිහිමත තම දූත කාර්යය පුරා වසර 12ක් පමණ විශ්ව එඬේරාණන් ලෙස නිමකර දෙව්පියාණන් වහන්සේ සමග සදාකාලික ජීවිතය කරා පිය මං කළ ෆ්‍රැන්සිස් සුදුතුම් පියතුමෙනි, ඔබ වහන්සේට සදා සාමය ලැබේවා යයි භක්ති ප්‍රබෝධනය ලේඛක, පාඨක සැම වෙනුවෙන් අපි ප්‍රාර්ථනා කරමින් යාච්ඤා කරමු.

හෙළිදරව්ව

# ඥාන පාත්‍රිණී



'ඥානය' යන්නෙන් දැනුම, අවබෝධය, නුවණ, බුද්ධිය යන තේරුම් මතු කරයි. 'පාත්‍රය' යන්න යම්කිසි දෙයක් හෝ ද්‍රව්‍යයක් රඳවා ගන්නට හැකි භාජනයක් හෝ බහාලුමකි. නිදසුනක් ලෙස කාලිස් පාත්‍රය තුළ මිදි යුෂ සහ ජලය රඳවා ගත හැකි ය. මෙවර තේමාව උපුටා ගෙන ඇත්තේ දේව මාතාවන් වහන්සේගේ ප්‍රාර්ථනාවේ සඳහන් යැදුමකිනි. මෙහිදී දේව මාතාවන් වහන්සේව "ඥාන පාත්‍රයක්" ලෙස උපමා කර ඇත. එහි බයිබලීය පදනමක් ද තිබෙන බව පැහැදිලි ය. මරියතුමිය නැණ නුවණින් සහ අවබෝධයෙන් පිරිපුන් තැනැත්තියක් ලෙස එතුමියව අධ්‍යයනය කරන ඕනෑ ම කෙනකුට තහවුරු කර ගත හැකි ය. මරිය තුමියගේ ගර්භාෂය නැමැති බහාලුමේ දේව පුත්‍රයාණන් මෙලොව එළිය දකින තුරු ජීවත් විය. ජේසුස් වහන්සේ මනුෂ්‍යත්වය ලබා ගන්නේ මරිය තුමිය තුළින් ය.

ගාබ්‍රියෙල් දේව දූතයා මරිය තුමියව ආමන්ත්‍රණය කරන්නේ "විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේවා. ස්වාමීන් වහන්සේ ඔබ සමග ය" (ලූක් 1:28). එහි දී මරියතුමිය අතිශයින් කැලඹුණත් දේව දූතයා එතුමියට මෙම උපතේ තතු විස්තර කරයි. දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය හරහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් මේ උපත සිද්ධ වන අතර දෙවියන් වහන්සේගේ ආනුභාවය එතුමිය වසා ගන්නවා යන්න ද දේව දූතයා ප්‍රකාශ කරයි (ලූක් 1:34-35). මරිය තුමිය මේ වදන් අයිති කර ගත්තා යන්න අපට පැහැදිලි වන්නේ එතුමිය ඊට දක්වන ප්‍රතිචාරය හරහා ය.

"බලන්න මේ මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස ම මට ඉටු වේවා යි කීවා ය" (ලූක් 1:38).

ජේසුස් වහන්සේගේ උපත ගවහලක සිදු වූවත් විවිධ අය විවිධ කථා බහ කළත් ඒ සියල්ල මරියතුමිය සිත්හි නිදන් කොට මෙනෙහි කළා ය යන්න සුවිශේෂකවරයා වාර්තා කරයි (ලූක් 2:19). ජේසුස් වහන්සේ වයස අවුරුදු දොළහේ දී නැති වී සම්භ වූ විට තම දෙමව්පියන්ට පවසන පිළිතුර ඉදිරියේ මරියතුමිය සියල්ල සිත්හි නිදන් කර ගත් අයුරු සුවිශේෂකවරයා යළිත් පවසයි (ලූක් 2:51). ක්‍රිස්තු විරෝධීන් විසින් ජේසුස් වහන්සේව කුරුසියේ ඇණ ගසා මරා දමන විට ද මරියතුමිය කුරුසිය පාමුල සිටින්නේ බලාපොරොත්තුවක් ඇතිව ය. යමක් කෙරෙහි බලාපොරොත්තුවක් ඇති කර ගන්නේ තමන්ට කිසියම් අවබෝධයක් සුළුවෙන් හෝ ඒ සම්බන්ධව තිබෙන නිසා ය. එබැවින් කුරුසිය පාමුල මරිය තුමිය සන්සුන් ය, නිශ්චල ය. ඉවසීමෙන් යුතු ව සෙසු ක්‍රිස්තු අනුගාමිකයන් කීප දෙනා සමග එතුමිය ද කුරුස පාමුල රැඳෙන අයුරු

එම ජවනිකාව තුළින් මනා ව පැහැදිලි වේ.

මරියතුමියගේ සමස්ත ජීවිතය පුරා ම එතුමියගේ ප්‍රතිචාර, වචන හසුරු වන ආකාරය ඇතුළු ක්‍රියාත්මක වන අයුරු නිරීක්ෂණය කරන ඕනෑ ම කෙනකුට පැහැදිලි කර ගත හැකි කාරණා කීපයක් මතු කරයි.

මරියතුමිය සාමාන්‍ය නුවණ, බුද්ධිය, හෝ දැනුමට එහා ගිය දේව ප්‍රඥාවක් ලබා ඇති බව පැහැදිලි ය. ශු. බයිබලයේ හිතෝපදේශ පොත මතු කරන්නේ ප්‍රඥාවේ මුල් පියවර දේව ගරු බිය වන අතර ශුද්ධ දෙවිඳුන් ගැන දැන හැඳින ගැනීම නැණ නුවණ ලෙස ය (9:10).

ශුද්ධාත්මයාණන් වහන්සේගේ දේව ප්‍රඥාව ලබා ගෙන ඇති අයුරු එතුමිය කළ කී දෙය තුළ පැහැදිලි ය. දෙවියන් වහන්සේගේ ගැලවීමේ කාර්යයට එතුමිය ප්‍රතිචාර දක්වන අයුරු අපූරු ය. එබැවින් අපට දැක ගත හැක්කේ මරියතුමියට සැබැවින් ම විචක්ෂණයක් තිබූ බව ය. විචක්ෂණය යනු හොඳ නරක අවබෝධ කර ගන්නට කෙනකු තුළ පහළ වන නැණ නුවණ සහ දූරදර්ශී ස්වභාවය යි. දෙවියන් වහන්සේගේ හඬට සුසර වෙමින් එයට අවනත වෙමින් ඊට නිවැරදි ව ප්‍රතිචාර දැක්වීමට ජීවිතය පුරා ම එතුමියට දේව ප්‍රඥාව ඉතා ඉහළ ම මට්ටමින් තිබූ බව සුවිශේෂ දෙස බලන විට අපට අවබෝධ කරගත හැකිය. එමෙන් ම මරියතුමිය ක්‍රිස්තුන් වහන්සේගේ පණිවුඩය අවබෝධ කරගත් සහ ජීවත් කළ උන් වහන්සේගේ පළමු පෙළේ අනුගාමිකයා වීමට සුදුසුකම් ලබයි. ජේසුස් වහන්සේගේ මෑණියන් සහ සහෝදරයන් උන්වහන්සේ සොයා ගෙන ආ විට ක්‍රිස්තුන් වහන්සේ පිරිස අමතමින් ප්‍රකාශ කළේ,

"දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන කවරෙක් හෝ වෙත්වා ඔව්හු මාගේ සහෝදරයෝත්, මාගේ මෑණියෝත් යන්න ය" (මාක් 5:35).

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ව කුරුසියේ එල්ලා මරා දැමීමෙන් අනතුරුව බියෙන් සැකෙන් සැඟවී සිටි ක්‍රිස්තු ශ්‍රාවක සංඝය ඒකාත්ම කරමින් එක්සිත් ව යාච්ඤා කරන්නට නායකත්වයක් ගැනීමට දේව මාතාවන්ට හැකි වූ බව පැහැදිලි ය (ක්‍රියා 1:14). එතුමියගේ ඥානය නැණ නුවණ මේ අවස්ථාවේ දී ද විද්‍යමාන වේ.

මේ සියල්ල අධ්‍යයනය කරන ක්‍රිස්තු අනුගාමිකයන්ට අවබෝධ වනුයේ උසස් අධ්‍යාපනයක් ලබමින් එදා සමාජයේ කැපී පෙනෙන විද්වත් චරිතයක් නොවුණත් එතුමිය සතු දේව ප්‍රඥාව තුළ මරියතුමිය ඉතා විනීතව, සංයමයෙන්, නැණ නුවණින්, කටයුතු කළ ආකාරය යි.

ඇතැම් අවස්ථාවල විධිමත් උසස් අධ්‍යාපනයක් ලැබූ කෙනකුට නොමැති ප්‍රායෝගික ඥානයක් එතුමිය සතු කර ගෙන තිබුණ බව මරියතුමිය හැසිරෙන ආකාරයෙන් සහ කී දෑවලින් අපට සක් සුදක් සේ පැහැදිලි ය.

එතුමිය සතු ඥානය සමස්ත ජීවිතය පුරා ම පාත්‍රයක රඳවා තිබූ ආකාරයක් මෙන් කෙනකුට දැක ගත හැකි ය. එවැනි දේව ප්‍රඥාවෙන්, නැණ නුවණින්, හෙබි මරිය අම්මාට "ඥාන පාත්‍රෙනි" යනුවෙන් උපමා කිරීම ශුද්ධ බයිබලයට හා සභා සම්ප්‍රදායට අනුව ද සමස්ත ජීවිතය පුරා ම විහිදෙන ශුද්ධාත්ම දීමනාවක් වන බව ප්‍රත්‍යක්ෂ වේ. එබැවින් දේව මාතාවන්ගේ ප්‍රාර්ථනාවේ දී එතුමියව "ඥාන පාත්‍රෙනී" යනුවෙන් උපමා කිරීම අතිශයින් ම උචිත ය.

ඥාන පාත්‍රෙනි, අප නිසා යාච්ඤා කළ මැනව.

**සංස්කාරක පියතුමා**

# 'ඥාන පාත්‍රෙනී' යනු කුමක්ද?

අප ජීවත් වන මානව සමාජය පිළිබඳව අවධානය යොමු කර බැලීමේ දී ස්ත්‍රී පුරුෂ යනුවෙන් කොට්ඨාස දෙකක් සිටිති. එමෙන් ම පවුල තුළ ද මව පියා යනුවෙන් පාර්ශව දෙකක් පවතින බව සඳහන් කිරීමට පුළුවන. එපමණක් නොව ශාක ලෝකය තුළ ද එම පාර්ශව පවත්නා අතර සතුන් අතර ද ගැහැනු පිරිමි යනුවෙන් කොටස් ද්විත්වයක් ඇත.

මනුෂ්‍යයා මෙලොවට බිහි වන්නේ මවකගේ කුස තුළිනි. ඒ නිසා මව ඉතා ශ්‍රේෂ්ඨ තැනැත්තියකි. "ලොව සියල්ල නිර්මාණය වී තිබෙන්නේ මවගේ කිරිවලින් හා හිරුගේ ආලෝකයෙන්" බැව් ජගත් කීර්තිධර ලේඛක මක්සිම් ගෝර්කි ප්‍රකාශ කර ඇත.

ලොව පවත්නා ප්‍රශ්න, වේදනාවලින් අඩක් ම දරන්නේ කාන්තාව බවට කියමනක් තිබේ. මෙම කරුණු මගින් ප්‍රත්‍යක්ෂ වන්නේ කාන්තාව සමාජය තුළ සුවිශේෂ තැනැත්තියක් වන බව ය. යථාර්ථය එය වුව ද වත්මන් සමාජය තුළ ඇතැමුන් අතර කාන්තාව සැලකෙන්නේ අඩු තක්සේරුවෙනි. එදා බ්‍රාහ්මණ සමාජය තුළ කාන්තාවට ලබා දුන්නේ අඩු මට්ටමකි. ඉතා පහත් තත්ත්වයකි.

කාන්තාවට මායම් 64ක් තිබෙන බවත් එමගින් එකිනෙකා රවටන බවට මෙන් ම ඔවුන් සිටින්නේ පිරිමින්ගේ ආශාවන් පිනවීමට බව එදා තිබූ මතයකි. එහෙත් වර්තමානයේ කාන්තාව අධ්‍යාපනය, දේශපාලනය, ආර්ථික, සාමාජික, ආගමික, සංස්කෘතික, විද්‍යාත්මක යනාදී ක්ෂේත්‍ර ආශ්‍රිත ව සාධනීය තත්ත්වයක් හිමි කර ගෙන තිබෙන බව විශද වන්නකි.

මීළඟට අපගේ විචාරාක්ෂිය යොමු කළ යුත්තේ මරිය වහන්සේ පිළිබඳව ය. මරියෝත්තමාවන් ලොව සියලු කතුන් අතර අග්‍ර ස්ථානය හිමි කර ගෙන සිටින්නී ය. එතුමිය ජම්ම පාප දෝෂයෙන් නිදොස් ව මෙලොවට උපත ලැබුවා ය. එසේ ම එතුමියගේ ස්වර්ගාරෝපණය ද සාන්ත සභා මාතාව පිළි ගන්නා ධර්මතාවකි. මූලික යථාර්ථයකි.

මරියතුමියව 'ඥාන පාත්‍රෙනි' යනුවෙන් දේව මාතා ප්‍රාර්ථනාවෙහි හැඳින් වෙන්නේ, ඕතුමිය ඥානය තුළින් පරිපූර්ණ වූ ආහාර භාජනයක් වන බව යි. එතුමියගේ ඥානයට මුල් වී තිබෙන්නේ දෙවියන් වහන්සේ ය. උන් වහන්සේ සියලු වනිතාවන් අතර බුද්ධිමත් ම කාන්තාව බවට මරියතුමිය පත් කළ සේක. ඊට පාදක වන්නේ කිතු සමිඳුන්ගේ ගැලවීමේ සැලැස්ම තුළ එතුමිය ඉතා විශාල කාර්යභාරයක් ඉටු කළා ය. ඒ සඳහා අවශ්‍ය කරන මග පෙන්වීම, කිතු හිමියන් පෝෂණය කිරීම, උන් වහන්සේ දිරිමත් කිරීම යනාදී ක්‍රියාවන් සඳහා එතුමිය බුද්ධිමත් ව කටයුතු කළ නිසා ය. ඒ පමණක් නොව එතුමියට ඉදිරිපත් කරන ප්‍රාර්ථනාවේ "විශාරද බුද්ධ්‍යග්‍ර වූ කන්‍යාවෙනී" යනුවෙන් ප්‍රකාශ කරන අතර එම ප්‍රකාශය ද ඥාන පාත්‍රෙනී යන ප්‍රකාශය හා බද්ධ වන්නකි. මරිය වහන්සේට ලැබී තිබෙන අසහාය බුද්ධිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අද්විතීය වන බව මෙනයින් ගම්‍ය වන්නකි.

එතුමියගේ බුද්ධිමත්භාවයට හේතු වන්නේ සත්‍ය වශයෙන් ම ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් යැපීමක් තිබූ නිසා ය. මරියතුමියගේ බුද්ධිමත්භාවය තහවුරු කරන එක් සිදුවීමක් ලෙස ගාබ්‍රියෙල් දේවදූතයා මංගලම් කීමේ දී ඇය තමන්ගේ අල්ප භාවය පිළිගත්තා ය. එතුමිය සිය අල්ප භාවය පිළිගත් නිසා ආත්මයාණෝ එතුමිය බලවත් කළහ; ශක්තිමත් කළහ. එදා ජේසුතුමා කුරුසය රැගෙන ගමන් කිරීමේ දී මෙතුමිය එතුමාට මුණ ගැසුණු විට ඇය නො හැඬූ අතර එයට මුල් වූයේ ද ඇයගේ උදාරතර බුද්ධි මහිමය යි. ඊට විකල්ප වශයෙන් ඇය කටයුතු කළා නම් එය කිතු සමිඳුන්ගේ විමුක්තියේ ඉතිහාසය දෙකඩ වන්නට මුල් වන්නට හේතු වන්නට ඉඩ තිබුණි. මෙලෙස මරියතුමිය ශුද්ධාත්මයාණන් වහන්සේට නිබඳව අවදි වූවා ය. උන් වහන්සේ කෙරෙහි පූර්ණ ඇදහිල්ල තැබුවා ය. උන් වහන්සේට නිරන්තරයෙන් නතු වූවා ය.

සොබා දහම හා මරියවහන්සේ අතර පැවතියේ අවියෝජනීය බන්ධනයකි; වෙන් කළ නොහැකි බැඳීමකි. ඕතුමිය ස්වකීය ජීවිත කාලය පුරා සොබා දහම තුළින් ධ්වනිත වන දේව මහිමය, දේව අලංකාරය අත් දුටුවා ය. ඒ ආශ්‍රිත සියලු ශබ්ද, ඝෝෂාවන් එතුමියට බාධා නො වූවා ය. එමගින් ද ප්‍රත්‍යක්ෂ වන්නේ ඇය බුද්ධිමත් ආකාරයට සොබා දහම සමග සම්බන්ධ වූ බව යි. දෙවිඳුන් අත්දැකීම සඳහා මෙන් ම දෙවිඳුන් වෙතින් පණිවිඩ ලබා ගැනීම සඳහා ද ඇය උත්සුක වූවා ය.

ඇහුම්කන් දීමේ හදවතක් තිබූ කුමරි මරියාවන් බුද්ධිමත් වීමේ රහස අන් කිසිවක් නොව දෙවිඳුන්ට මූලිකත්වය ලබා දීම යි. එපමණක් නොව ඇය අපට පවසන්නේ ද ආත්මයාණන් වහන්සේගේ පරක් තෙරක් නැති බුද්ධි ප්‍රභාවට නතු වන ලෙස ය. අපට ආවේණික මං මාවත්වලින් ඈත් වී දේව කැමැත්ත හඳුනා ගන්නා ලෙස ය.


අප කුමක් කළත් ඒ සියල්ල දේව මහිමය සඳහා කරන ලෙස එතුමිය ද අපට ඇරැයුම් කරන්නී ය. අප සාමාන්‍යයෙන් උගත්කම මනින්නේ සම්මාන, සහතික, උපාධි යනාදි දේවල් මුල් කර ගනිමිනි.

එහෙත් එය මෙලොවට පමණක් සීමා වේ. එය ලෝක ප්‍රඥාවට අයත් වේ. එහෙත් දේව ප්‍රඥාව ඊට හාත්පසින් ම වෙනස් දෙයකි. දේව ප්‍රඥාව ලද තැනැත්තා, ඊට ඇලුම් කරන්නා අව්‍යාජ යථාර්ථවාදියෙකි. ඔහුට සීමා බන්ධන නොමැත.

ශුද්ධවර ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමා, ශුද්ධවර තෝමස් ඇක්වයිනස් මුනිතුමා යනාදි මුනිවරු ලෝක ප්‍රඥාවට වඩා, ඊට ඔබ්බට ගිය ප්‍රඥාවට හිමිකම් කීහ. මරියෝත්තමාව ද සියලු අවස්ථාවල දී මුනිවත රැක්කේ දේව ප්‍රඥාවෙන් පූර්ණ වීම සඳහා ය. ඒ නිසා එතුමියට ඇත්ත, ඇති සැටියෙන් දකින්නට පහසු විය. එලෙස අප ද සැබෑ වූත්, අවසන් වූත් දේව ප්‍රඥාවට ඇලුම් කිරීම සඳහා කටයුතු කිරීම දේව අභිමතය වන්නේ ය.

**මලින්ත බෝපෙආරච්චි**
**දලුගම, කැලණිය.**

# අම්මේ ආදර අම්මේ



අම්මේ ආදර අම්මේ
දෙව් පුත් කුමරුගෙ අම්මේ
අම්මේ ආදර අම්මේ
මගේ ම ආදර දෙව් අම්මේ

දෙව් අභිමතයට හිස නැමූ අම්මේ
පෙන්වනු ඔබ පුතු මා හට
දෙවිඳුන් ඉදිරියෙ හිස නමනට
දෙව් අභිමතයේ ආදර අම්මේ

සතුටු කිරුළ දැරූ දෙව් අම්මේ
පවසනු ඔබ පුතු මා හට
යන මාවත ජීවිත සතුටට
දෙව් ප්‍රේමයේ ආදර අම්මේ

දිරියෙන් නපුරා පාගා දැමූ අම්මේ
පෙන්වනු ඔබ පුතු මා හට
ජය මාවත නපුරා පාගන්නට
නපුරා ජයගත් ආදර අම්මේ

මනුසත් බවෙ මායිම පසු කළ අම්මේ
පවසනු ඔබ පුතු මා හට
දෙව් පෙම දම් පතුරන්නට
මිනිස් දීනත්වයේ ආදර අම්මේ

සුරලොව කිරුළෙන් හැඩ වුණ අම්මේ
පෙන්වනු ඔබ පුතු මා හට
දෙව් පිය මුව දකිනට
සුරලොව දෙව් රැජිනිය අම්මේ

**දිල්ශාන් මධුරංග සහෝදරතුමා**
**ජේසු නිකායික ආධුනිකාරාමය,**
**කුරුණෑගල.**

# අතීතයේ මතකයන් වර්තමානයේ ජය මාවත යි...

අතීතයේ මතකයන් සිත පාරවයි.
හදවතේ සියුම් තැන්වලට යෑම ද කටුක ය.
හදවතේ සියුම් තැන් ගැන සිතීම ද අපහසු ය.
ඒ සියුම් තැන් දැන් වන විට අපූරු දේවල් වී හමාර ය.
මා මෙතරම් දුරක් පැමිණෙන්නට උදව් වූයේ එම අතීතයන් ය.
සමිඳුනි, ඔබ මට දුන් අභියෝග යැයි මට දැනෙන්නෙමි.
අඳුරු මතකයන් ද මගේ ජීවිතයට ආලෝකයක් ගෙන දුන්නේ ය.
කැඩුණු, බිඳුණු, තැළුණු සිත් එකතු කිරීමෙන් ලස්සන නිර්මාණයක් බිහි වේ.
මගේ හදවත ලස්සන හදවතක් කර ගත හැකි ය.
අතීතයේ මතකයන් අසුන්දර වූව ද
වර්තමානයේ එම මතකයන් සුන්දර වනු ඇත.
අතීතයේ දී සිදු වූ දේවල් වර්තමානයේ දී සිදු විය හැක.
අතීත මතකයන්ට පණක් දෙයි වර්තමාන ජීවිත රටාව ලස්සන කර ගැනීමට
අතීත මතකයන්ට ස්තුති කරමින්
වර්තමානය තුළ පණ පොවන්නට වෙර දරන්නෙමු.
අතීතය වර්තමාන ගමනට හයියක් වෙනවා නො අනුමාන ය.
අතීතයේ වැරැද්ද වර්තමානයේ නිවැරැදි බවට පත් වන්නේ ය.
අතීතයේ පරාජය වර්තමානයේ ජය බවට පත් වන්නේ ය.
අතීතයේ අභියෝග වර්තමානයේ සාර්ථකත්වයට පත් වන්නේ ය.
අතීතයේ දුක වර්තමානයේ සතුටක් බවට හැර වෙන්නේ ය.
අතීතයට වෛර කරමින් සිටි කාලය අවසන් කොට
අතීතයට ආදරය කරන්නට පටන් ගන්න කාලයේ ආරම්භය යි.
අතීතයේ දේවල් සමග රැඳී නොසිට වර්තමානයට සතුටින් පා තබමු.

**කේ. ජී. රනිදි මින්දුලා**
**යහපත් එඬේරාගේ කන්‍යාරාමය,**
**බණ්ඩාරවෙල.**

# 'ඥාන පාත්‍රනි' අර්ථ විවරණය හා මෙනෙහි කිරීම

දේවමාතා ප්‍රාර්ථනාවේ දේවමාතාවන් වහන්සේ පාත්‍රයක් නොහොත් බඳුනක් ලෙස හඳුන්වන යෙදුම් තුනකි. මේ යෙදුම් ත්‍රිත්වය එන්නේ ලතින් බසින් 'Vas' හෙවත් ඉංග්‍රීසියෙන් 'Vessel' යන වදන හා සමගිනි. මෙහි දී අපි මරියෝත්තමාවන් දෙස බලනුයේ දෙවිඳුන් නැතහොත් දෙව්පුතුන් දරා සිටි බඳුනක් ලෙසිනි.

පස්වන සියවසේ විසූ ශු. ජෝන් ක්‍රිසොස්තම් සහා පියතුමා මරියතුමියව හඳුන්වන්නේ තමන් වහන්සේගේ දිව්‍යමය ජීවිතය නම් අගනා මිදිරස දැමූ අලංකාර පළිඟු කුසලානයක් ලෙසිනි. 2003 වසරේ දී ශු. දෙවන ජුවාම් පාවුළු පාප්තුමන් ගැලවීමේ ඉතිහාසය තුළ එතුමියගේ භූමිකාව විස්තර කරන්නේ එතුමිය දිව්‍ය සත්ප්‍රසාද නිවහනක් ලෙස අරුත් ගන්වමිනි. මාංශගත වූ දෙවිඳුන් කුසේ දරාගෙන එලිසබෙත්තුමිය බැහැදැකීමට ගිය අවස්ථාව හා සසඳමින් ඕතොමෝ දිව්‍ය සත්ප්‍රසාද නිවහනක් ලෙස මෙහි දී එතුමා ඉදිරිපත් කරයි.

මෙම ලතින් වදන ග්‍රීක පරිවර්තනය 'Skeuos' යන වදන යි. ඉන් භාජනය යන අදහසට අමතරව උපකරණයක් හෝ යමක් කිරීමට යොදා ගන්නා ආයුධයක් යන අදහස ලබා දෙයි. මේ අනුව ගත් කල මරිය මාතාවෝ ශුද්ධාත්මයාණන් වහන්සේගේ උපකරණයක් හා උන් වහන්සේ වැඩ සිටින වාසස්ථානයක් යන අදහස ද ගම්‍ය වේ.

'Vas Spirituale' යන ලතින් යෙදුමෙන් මරියෝත්තමාවෝ පියවි දෙනෙතට අදෘෂ්‍යමාන ආත්මික වූ යමක් දරා සිටින ආත්මික බඳුනක් බව කියැවේ. එහි සිංහල පරිවර්තනය වන 'ඥාන පාත්‍රනි' යන්නෙහි 'ඥානය' වනාහි කිතු සමිඳුන් වෙනුවෙන් යෙදෙන පර්යාය පදයක් ලෙස ගත හැක.

<u>මෙනෙහි කිරීම</u>

මැයි මාසය විශේෂයෙන් දේව මාතාවන්ට කැපකර ඇති මාසයකි. අප දේශීය සහා සම්ප්‍රදාය නම් දේවමාතා ප්‍රතිමා ගෙදරින් ගෙදරට රැගෙන ගොස් යාච්ඤා කිරීම යි. මාසය අවසානයේ, එනම් මැයි 31 දින දේව මාතාවන් එලිසබෙත් තුමිය බැහැදැකීමට ගිය මංගල්‍යය සමරනු ලබයි.

'ජෙහෝවා ශම්මා' (Jehovah Shammah) යනු දෙවියන්ගේ වැඩ සිටීම කියැවෙන 'දෙවියන් මෙතැන යි' යන්නට පරිවර්තනය වන හෙබ්‍රෙව් වචනය යි. ශු. බයිබලයේ එසකියෙල්ගේ දර්ශනයේ දී නගරයට දෙනු ලබන නාමය ද මෙය යි. (එසකියෙල් 48:35) පුරාණ ගිවිසුමේ ජනතාව දෙවියන්ගේ වැඩ සිටීම අත්දැක්කේ සහ එයට වන්දනාමාන කළේ ගිවිසුම් කරඬුව හා සබැඳිව යි. සලොමොන් රජු දේව මාළිගයේ ඉහළ ම / උසස් ම තැන ඊට ලබා දෙයි. ඒ මන්දයත් ඒ තුළඃ දස පනත ද, ආරොන්ගේ සරයටිය ද, මන්නා කැබලි ද වූ බැවිනි. මෙකී ත්‍රිත්වය දෙවියන්ගේ වැඩසිටීම නිරූපණය කළේ ය. එහි ආනුභාවය කෙතරම් ද යත් ඊට අත ගැසූ මිනිසෙකු එතැන ම ඇද වැටී මරණයට පත් විය. එම නිසා ඊට නිසි ගෞරවය දීමට දාවිත් රජු ඒ ඉදිරියේ නර්තනයේ යෙදෙයි.

නව ගිවිසුමේ අපට හමුවන ගිවිසුම් කරඬුව නම් මරියෝත්තමාවන් වහන්සේ යි. එතුමිය 'දස පනත' නොව 'වචනය' තම කුස තුළ දැරුවා ය... 'මන්නා' නොව 'ක්‍රිස්තු ශ්‍රී ශරීරය' දැරුවා ය... 'ආරොන්ගේ සරයටිය' නොව 'සමිඳාණන්ගේ අධිකාරී බලය' දැරුවා ය. මෙලෙස අද යථෝක්ත අර්ථ විවරණයේ ප්‍රකාර 'ඥාන පාත්‍රය' වූවා ය. දෙවියන්ගේ වැඩසිටීම දරමින් ඈ ගමන් කළා ය. එතුමිය හමුවීමෙන් එලිසබෙත්තුමිය කුස වන් බිළිඳා පිනා යන්නේ දෙවිඳුන් දේව වැඩ සිටීම ඉදිරියේ නර්තනයේ නියැළුණ සේ ය. එතුමිය ගොඩ වැදුණ සැම තැනක් ම දේව වැඩ සිටීම කරණකොට ගෙන වෙනස් විය. එතුමියගේ සම්ප්‍රාප්තිය කානා නුවර විවාහ උත්සවයේ තත්ත්වය පවා වෙනස් කළේ ය.

13 වන පිටුවට .....

**තීක්ෂණ පෙරේරා**
**ශ්‍රී හෘදයේ ආධුනිකාරාමය, බණ්ඩාරවෙල.**

# ලිවීම හා කියවීම, දිවැසිවර හා එඬේරික කාර්යයන්

**පසුගිය කලාපයෙන්...**

අද මේ හමුවට අර්ථයක් ලබා දෙන්න දෙවිඳුන් අපිට කතා කරන තැන මෙතන යි. අපේ යුගයේ දේව අනාවරණයට අපි විවෘත නෑ. අපි රජයේ හා මුදලාලිගේ රූපවාහිනිවල ප්‍රවෘත්ති, වැඩසටහන් බලන්න, ඊනියා දේශපාලන සංවාද බලන්න, සමාජ මාධ්‍ය ජාලවල ඉහළ පහළ යන්න වැය කරන කාලයෙන් කොපමණ කාලයක් මේ දේව අනාවරණයන් කියවන්න යොදා ගන්නවා ද? අපි ඇත්තට ම අපේ කාලයේ දේව අනාවරණයට විවෘත නෑ නේ ද? සුපුවතේ ආනන්දය වන මේ ලියවිල්ල පමණක් සැලකිල්ලට ගත්තත් සභා චින්තනයේ විප්ලවීය වෙනසක් සිදු කළ ලියවිල්ලක්. ඉතිහාසයේ ප්‍රථම වතාවට අපි ජීවත්වන ලෝකයේ දුක්ඛිතභාවයට හේතුව ඍජුවම, පැහැදිලිව ම ප්‍රකාශ කරන සහ ඉගැන්වීම මෙය යි.

පරිභෝජනවාදයේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන ලෝකය මුහුණ දෙන භයානක දේ නම් මසුරු හදවත් තෘප්තිමත් වීමෙන් ලැබෙන සන්තාපයක්, නිස්සාර සතුටක් කරා ලුහුබැඳ යාම සහ අසංවේදී හෘද සාක්ෂියත් ය. අපගේ ඇතුළාන්ත ජීවිතය අපගේ ම ආශාවන් හා කාර්යයන් උදෙසා ම පමණක් යොමුවූ විට අන් අය ගැන හා දිළින්දන් ගැන හෝ සිතීමට ඉඩක් අප තුළ ඉතිරි වන්නේ නැත. තව දුරටත් උන්වහන්සේ කට හඬ නෑසෙනු ඇත. යහපත කිරීමට ඇති ආශාව බොඳ වී යයි. විශ්වාසිකයින් මුහුණ දෙන අතිභයානක දේ මෙය යි. බොහෝ දෙනෙකු එහි ගොදුරක් වී හමාර ය.

උන් වහන්සේ ලේඛනයට පිවිසෙන්නේ එසේ ය. උන් වහන්සේ මේ ලියවිල්ල තුළ අපේ වචනයෙන් කියනවා නම් සන්තුෂ්ටියේ දේව ධර්මය අනාවරණය කරනවා.

ඇත්තට ම ඔබ සිටින්නේ සතුටින් ද? අපේ හමුවීම්වල තිබෙන ලොකු මානසික අවුලක් තමයි අපි නිතර ම අසතුට බෙදා ගැනීම. ප්‍රැන්සිස් පාප් තුමා කියනවා හුඟාක් කිතුනුවන් පාස්කුවක් නැති චතාරිකයක් වැනි ජීවිත ගත කරන අය කියලා. හුඟ දෙනෙක් මේ දැන් තමාගේ ආදරණීයකුගේ මළ ගෙදර ගිය අය වගෙයි කියලා. උන් වහන්සේ කෙලින් ම මෙහෙම කියනවා.

කුඩා හෝ අභිමානයක් සහිතව මේ ලෝකය තුළ ජීවත් වීම සැබැවින් ම දුෂ්කර ය. ඒ සඳහා අප ප්‍රතික්ෂේප කළ යුතු, වෙනස් කළ යුතු තත්ත්වයන් මෙසේ පෙන්වා දෙයි.

**1. බැහැර කිරීමේ ආර්ථික ක්‍රමය ප්‍රතික්ෂේප කිරීම.**

උන් වහන්සේ කියන්නේ ජීවිතය විනාශ නොකරව යන විධානය ම මේ ආර්ථික ක්‍රමය වෙත ද එල්ල කළ යුතු බව යි. මෙතෙක් කල් කතෝලික සමාජ දර්ශනය තිබුණේ මේ කාරණයේ දී වැනි වැනි. ඒකට හේතුව තමයි මේ ක්‍රමය ඍජුවම ප්‍රතික්ෂේප කිරීම කියන්නේ සභාව සමාජවාදයට පක්ෂ වීමක් වැනි අදහසක් ජනිත කරවිය හැකි යි කියන හේතුව. නමුත් ප්‍රැන්සිස් පාප්තුමන් තුළින් දෙවියන් ඒ අතීත බියෙන් අපිව මුදවනවා නම් උන් වහන්සේ කියනවා, මේ ක්‍රමය මිනිසාව දෙයක් කෑල්ලක් බවට ඌනනය කරලා කියලා. (මේක කාලයක් පුරා විකල්ප ධාරාවේ ප්‍රාඥයින් විසින් මතු කළ අදහසක්) ඒ නිසා දැන් තියෙන්නේ මිනිසාව සූරාකෑම හෝ පාලකයින්-ධනවතුන් කෲර ලෙස සැලකීමක් නොවේ. ඊට වඩා වෙනස් අලුත් ම තත්ත්වයක්.

'මිනිසුන්ව පාරිභෝගික ද්‍රව්‍ය සේ භාවිත කොට ඉවත දැමීම' (මානව කසළ සේ ඉවත දැමීම)

පාප් තුමන් අද මේ කියන කාරණය මීට අවුරුදු 50කට විතර කලින් චාලි චැප්ලින් මේ විදිහට කියනවා. මිනිසුන් ඇත්තේ ආදරය කිරීමට ය. ද්‍රව්‍ය ඇත්තේ පාවිච්චි කිරීමට ය. නමුත් අද මිනිස්සුන් පාවිච්චි කරමින් ද්‍රව්‍යවලට ආදරය කරමින් තිබෙනවා.' ඒ නිසා තමයි උන් වහන්සේ කියන්නේ මේ ක්‍රමය තුළ හිසට සෙවණක් නැතිව කුසගින්නේ ගැහි ගැහී මිය යන මිනිසුන් ප්‍රවෘත්තියක් නොවී කොටස් වෙළඳපළේ දර්ශකය ඒකකයකින් අඩු

වීම ප්‍රවෘත්තියක් වෙනවා කියලා. අතීතයේ දී විශේෂයෙන් පෙරදිග මිනිසුන් වගේ ම ලෝකයේ හැම තැන ම සොබා දහම සමග බැඳුණු මිනිසුන් ද්‍රව්‍ය පවා දුටුවේ ජීවිත ලෙස එක ම ජීවාත්මයක කොටස් ලෙස. ඒ නිසා ඔවුන් තමන් භාවිත කළ ද්‍රව්‍යවලට පවා කිසියම් ආකාරයක ගරුත්වයක් ලබා දුන්නා. අන්න ඒ ප්‍රඥාව තමයි වර්තමාන ආර්ථික ක්‍රමය අපට අහිමි කළේ.

අපි මොන මොන දේශන පවත්වමින් සිටියත්, මොන මොන සක්‍රමේන්තු දෙමින් සිටියත්, මොන මොන වැඩසටහන්, ධර්ම විවේක සිදු කරමින් සිටියත්, ඒවා මේ යථාර්ථය වෙනසක් කිරීමට බලපාන්නේ නැත්නම් එතැන ධර්ම දානයක් නෑ. එතැන එඬේරික කාර්යයක් නෑ. එතැන දිවැසිවර කාර්යයක් නෑ. ඉහත පැහැදිලි කළේ උන් වහන්සේ දක්වන එක කරුණක්. අනිත් දේ ඔබ කියවන්න. මාතෘකා කීපයක් විතරක් මතක් කරන්නම්.

- මුදල දේවත්වයෙන් පිදීම ප්‍රතික්ෂේප කිරීම. මුදල නූතන රන්වස්සා වැඳීම යි.
- මූල්‍ය ක්‍රමය ප්‍රතික්ෂේප කිරීම.
- ප්‍රචණ්ඩත්වය ජනිත කරන අසමානතා ප්‍රතික්ෂේප කිරීම.

කව්ද මෙතැන සිටිය අයගෙන් කියවා තිබෙන්නේ. 'සියල්ලෝ සහෝදරයෝ' ලේඛනයට පදනම් වූ පසුබිම. අප්‍රේල් 21 ප්‍රහාරයට යුක්තිය සොයන ලංකාවට අතිශය වැදගත් ලේඛනයක් වූ 'මානව සහෝදරත්වය' ලේඛනය පාප් තුමන් සාකච්ඡා කරන ලෙස ඉල්ලා සිටියත් ලංකාවේ කොතැනකවත් ඒ සාකච්ඡාව සිදු වෙනවා අප දැක නෑ. ඉස්ලාම්-ක්‍රිස්තියානි සංවාදය පිළිබඳ ඉතා බරපතළ අදහසක්. බරපතළ ඉතිහාසයක් මේ ලියවිල්ල අපට අනාවරණය කරනවා.

**ලිවීමේ අවංකකම**

ප්‍රැන්සිස් පාප් තුමන්ගේ 'ලව්ඩා ටෝ සි' (වේ ප්‍රශංසා) විශ්ව ලේඛනය දෙසට අපි මඳක් හැරෙමු. උන් වහන්සේ ඉතා වැදගත් දෙයක් ලිවීම ගැන අපිට ක්‍රියාවෙන් පෙන්වා දෙනවා. ඒ තමයි අවංකකම ශුද්ධවූ බයිබලයේ තියෙන්නේ එදා පැවැති නිල ධූරාවලින් නිල ආගමෙන් බැහැර කළ විමුක්ති ගමනක යෙදුණු මිනිසුන්ගේ අත්දැකීම්වල එකතුවක්. අදත් ඒක එහෙම ම යි. සැබෑ දේව අනාවරණය අපි පසෙකින් තබනවා. ඒ ඇයි ඒක අභියෝගයක් පාප් තුමා අවංකව කියනවා. සුදතුම් පියවරුන්ගේ මෙම ප්‍රකාශනයෙන් ප්‍රතිරාව නංවනුයේ මෙම ගැටලු පිළිබඳ සහා චින්තන සාරවත් කළ බොහෝ විද්‍යාඥයින්ගේ දාර්ශනිකයන්ගේ ප්‍රජා කණ්ඩායම්වල ආවර්ජනයන් ය කියන කාරණයන් ය. ලිවීමට අවංක වෙන්න. මූලාශ්‍ර හෙළි කරන්න. කොපි කරන්න එපා. අද හුඟාක් වෙලාවට තියෙන්නේ කොපි පේස්ට් කිරීම. කොහෙන් හරි උපුටලා කරුණු දැක්වීම. එය අපි මුලින් සඳහන් කළ සැබෑ කියවීමෙන් මිනිසුන්ව ඈත් කරනවා. ඒ නිසා කියවීම ප්‍රගුණ කරන්න.

**ලිවීම හා භක්ති ප්‍රබෝධනය**

කියවන්න නම් ලියන්න අවශ්‍ය යි. ලිවීම සම්බන්ධයෙනුත් කියවීම සම්බන්ධයෙනුත් ඉහත දැක්වූ අදහස් එක ලෙස ම අදාළ වෙනවා. අද මේ සාකච්ඡාව පැවැත්වන්නේ මුද්‍රණ ද්වාරයෙන් පළවන අවුරුදු 125 ක් පැරණි සඟරාවක් නිමිති කරගෙන. මුද්‍රිත සඟරා වර්තමානයට අදාළ ද? ඒ ප්‍රශ්නය ලෝකය තුළ සාකච්ඡා කරනවා. ඩිජිටල්කරණය වූ ඊ හා අයි පරපුරක් ජීවත් වන මේ යුගයක එය අදාළ ද ? ඊ පොත් යුගය තුළ මුද්‍රිත පොත්, සඟරා තව දුරටත් වලංගු ද ? ලංකාව ඉතා පොහොසත් සඟරා සම්ප්‍රදායක් තිබුණු රටක්. වර්තමානය වන විට එවැනි සඟරා නැති තරම්. නමුත් ඊ - සඟරා, ඊ - පත්තර අතරතුර වුව ද මුද්‍රිත කියවීමේ වටිනාකම හා ඵලප්‍රයෝජන නිෂේධ වෙන්නේ නෑ. මේ මෑතක මුද්‍රිත කියවීම ගැන වැදගත්කම ගැන හුවමාරු වූ ෆේස්බුක් සටහනක දැක්වුණු කරුණු කීපයක්.

- ඔබ වැඩි තොරතුරු ප්‍රමාණයක් අවශෝෂණය කර ගනී.
- මුද්‍රිත පොත් කියවන්නෝ සිය දරුවන්ට වඩා හොඳ පාඨකයින් වීමට උපකාර කරති.
- මුද්‍රිත පොත් ඇස්වලට වඩා පහසු ය.
- ඔබට වඩා හොඳ නින්දක් ළඟා කර දීමට මුද්‍රිත පොත් කියවීමට උපකාර කළ

හැකිය.

- මුද්‍රිත පොත් කියවීමේ දී ඔබේ අවධානය වෙනතකට යොමු වීමට ඇති ඉඩකඩ අඩු ය.
- නිවසේ පුස්තකාලයක් තිබීම හා උසස් අධ්‍යයන ජයග්‍රහණ අතර සම්බන්ධ ය.
- මුද්‍රිත පොත් විසින් කියවීමේ සතුට වැඩි කරනු ලබයි.

**කියවීමට යොමු කිරීමේ දූත කාර්යය**

සභාවන් සිදු කරන සම්ප්‍රදායික දූත කාර්යයන්වලට අතිරේකව නූතන යුගයට අදාළ අලුත් දූත කාර්යයන් රාශියක් තිබෙනවා. දැනට අපිට පොත්පත් සඟරා පුවත් ප්‍රකාශ කිරීමේ දූත කාර්යයක් තිබෙනවා. හැබැයි කියවීමට යොමු කිරීමේ දූත කාර්යය ඒ සඳහා නවමු සෙවීමේ දූත කාර්යය අපි බරපතළව අරගෙන නෑ. එය සම්මාන උත්සව පැවැත්වීමෙන් ඔබ්බට කාරණයක්. ඕනෑ ම කලාවක් මාධ්‍යයක් පවතින්නේ එහි ඉලක්කය වන පාඨක රසික ප්‍රජාවක් මත. පාඨකයා රසිකයා නිර්මාණ කිරීම දැවැන්ත දූත කාර්යයක්. එය ඉටු කිරීමට දෙවියන් අප කැඳවනවා.

කුමන තත්ත්වයන් මැද වූවත් භක්ති ප්‍රබෝධනය තවමත් පිටපත් 6000 ක් අලෙවි වීම ලංකාවේ ඇතුලේ ආශ්චර්යයක්. එම ආශ්චර්ය සඳහා දායක වන සියලු දෙනා අගය කළ යුතු ම යි. විශේෂයෙන් ගම් මට්ටමින් එය බෙදා හැරීමට ක්‍රියා කරන සියලු දෙනා අප අගය කළ යුතුයි. මන් ද සංස්කාරකවරුන්ට ලේඛකයින්ට ඔවුන්ගේ කාර්යය සඳහා යම් පිළිගැනීමක් හිමි වූවත්, ඔවුන්ගේ නම් ගම් ආදිය පළ වූවත් මේ බෙදා හරින්නන් තම කාර්ය ඉටුකරන්නේ එවැනි වූ ප්‍රතිලාභයක්වත් නොමැතිව යි. ප්‍රබෝධනයේ ඉදිරි ගමනට අවශ්‍ය වන්නේ පාඨකයාට උපරිම සාධාරණයක් ඉටු කරන මාධ්‍යයක් බවට එය වඩ වඩාත් පත් කිරීම යි. ඒ සඳහා ලේඛක, පාඨක, සංස්කාරක ප්‍රජාව මෙන්ම සමස්ත සභාව ම එක්සිත්ව එක්සත්ව කටයුතු කළ යුතු ය. ඒ සඳහා සියලු දෙනාට අවශ්‍ය ආලෝකය ලැබේවා.

**මහින්ද නාමල්**

# අපේ මෑණියෝ

ජේසුතුමා ලොවට ගෙනා මෑණියෝ
ආදරයෙන් ජේසු බලා ගත්ත මෑණියෝ
අපවත් ඔබේ තුරුලට ගන්න මෑණියෝ
හරි ආසයි ඔබ ළඟට එන්න මෑණියෝ

කල්වාරියෙ දුකින් පිරුණ මෑණියෝ
ජේසු පුතා පසු පස ගිය මෑණියෝ
රුදු හෙල්ලෙට බය නැතිව මෑණියෝ
කුරුසිය පාමුලට ම ගියා මෑණියෝ

මෙන්න ඔබේ අම්ම කියාලා
මෙන්න ඔබේ පුතා කියාලා
අපට බාර දුන්න මෑණියෝ
හැමදාමත් අපට ආදරේ අපේ මෑණියෝ

**දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු**
**6 වසර, ශා. ජෝශප් විදුහල, මරදාන**

# නිමල මවුනි

ලෝ වැසි දනන්
පවින් මුදා
විමුක්තියේ ජය කෙහෙළි
නංවන්නට
සමිඳු අණින්
පුතකු බිහි කළ
නිමල මවුනි...
දෙව්පුතු සරණ යන්නට
පතමු අද අපි
ඔබගේ මැදිහත් බව
දොහොත් මුදුන් දී
ඔබේ නිමල දිවියෙන්
අපේ දිවිය ද
පුරවාලනු මැනවි
අපට හැකි වෙයි එවිට
සමිඳුන් වෙත විගස
ළං වන්නට මවුනි...

**සී. ආර්. ඩික්සන් ඇන්ටනී**

# ලේඛන කලාව

සාහිත්‍යයෙන් ජීවිතාලෝකය ලැබේ. නමුත් සාහිත්‍යකරුවන්ගේ කැපවීම් ඵලදායක වන්නේ ඔහු ජන රසිකත්වය කුමන මට්ටමක පවතී ද යන්න මත ය.

සමහර සිසුන් කියවන්නේ අධ්‍යාපනික පොත පත පමණ ය. සමහරුන් කියවන්නේ තම වෘත්තියට අදාළ දේ පමණ ය. සමහරුන් කියවන්නේ උණුසුම් ප්‍රවෘත්ති පමණ ය. අවිවේකි ජීවිතයට ඇබ්බැහි වීම නිසා මිනිසා කියවීමෙන් ඈත් වේ. එහෙත් එතරම් උගත්කමක් හෝ වෘත්තියමය වැදගත්කමක් නැති සාහිත්‍ය රසිකයෝත් සිටිති. එවැනි වූ නිර්මාණකරුවෝත් සිටිති.

අකාලික අගයකින් යුත් උත්තම සාහිත්‍ය කෘතීන් බහු ජන රුචිකත්වයට ළං වීමට සෑහෙන කලක් ගත වේ. සමහර විට කතුවරයා ජීවත් ව සිටිය දී එය සිදු නො වේ.

මහගම සේකරයන්ගේ මුල් කාලීන කවි පොත් මා මිලට ගත්තේ පේමන්ට් වෙළෙන්දෙකුගෙනි; පොතේ මිලට වඩා අතිශයින් අඩුවෙනි. සේකරයන්ගේ හැම කවි පොතක් ම මට සාහිත්‍ය කෘතියකට වඩා ධර්ම චාරිකාවකි. කලකරුවෙකුට වඩා එතුමා මට ධර්මගවේෂී චින්තකයෙකි.

හරය අවම වුවත් රසය උපරිම වූ නිර්මාණ ඉතා වේගයෙන් ජනප්‍රිය වේ. එහෙත් එවැනි කෘතීන් කෙරෙහි වූ බහු ජන රුචිය දිගුකාලීනව නො පවතී. ඩීමන් ආනන්දයන්ගේ නවකතා ඊට නිදසුනකි. පොත් නො කියවන්නන් තුළ කියවීමේ රුචිය නැංවීමට එවැනි කෘතීන් අනුබලයක් වේ.

ග්‍රන්ථ ගැන විමර්ශනාත්මක සංවාද ජනතාවගේ රසිකත්වය මුවහත් වීමට බෙහෙවින් ඉවහල් වේ. ආචාර්ය අධිකාරම් මහතා විසින් සිතිවිලි යනුවෙන් කුඩා පොත් මාලාවක් පළ කළේ ය. ඒවා සාහිත්‍ය කෘතීන් නො වී ය; ශාස්ත්‍රීය නිබන්ධන ද නො වී ය. නිරවුල් සරල බසින් ලියැවෙන එවැනි කෘතීන්ගෙන් ද ජීවිතාලෝකය ලැබේ.

යම් කෘතියක සාහිත්‍යමය අගය අඩු වූ පමණින් එය නීරස හෝ නිසරු වන්නේ නැත. ප්‍රකාශනයෙහි ඇති නැවුම්කම, අව්‍යාජකම, සරලකම සහ අප කාගේත් දෛනිකය කෙරෙහි වූ එහි අදාළකම අනුව කියවන්නාට එයින් ආලෝකයත් ශක්තියත් හා මිහිරක් ලැබේ.

**සපුගස්කන්දේ රංජිත්**

**'ඥාන පාත්‍රෙනි' අර්ථ විවරණය හා මෙනෙහි කිරීම 9 වන පිටුවෙන්.....**

ජුවාම් 19 ප්‍රකාර 'මෙන්න ඔබගේ මෑණියෝ' ලෙස කුරුස පාමුල ජුවාම් ගෝලයාට ඕතුමිය බාර විය. ඉන් අනතුරු ව ඔහුගේ ජීවිතය වෙනස් විය. 'සේනාකුළු' ශාලාවේ ඇගේ වැඩ සිටීම බියෙන් උන් ගෝලයන් වෙනස් කළ සේක.

<u>යැදුම</u>

ඥාන පාත්‍රෙනි, වඩින්න අප රටට, පවුලට, මීසමට, සංසයට, හදවතට...
දරමින් දෙවියන්ගේ ජීවමාන වැඩ සිටීම...
රැගෙන දෙව්දූතන්ගේ ස්ප්‍රීතුව...
බිය, සැක මකාලන්න සේනාකුළුවේ මෙන්...
හිස් බව පුරවන්න කානාවේ මෙන්...
නිර්මාණය කරන්න නිවසක්,
ලැගුම් ගන්න ඔබ පුතු හට,
අප හදවතේ, සංසයේ, මීසමේ, පවුලේ, දේශයේ...

ආමෙන්.

# මරණය පෙණි පෙණි අම්මාට ලියූ ලිපිය

ඔහු ඉල්ලා සිටියා පෑනකුයි කොළයකුයි... ඔහු ලියපු දේ දුටුවොත්...
ඔබටත් සිතන්නට දෙයක් තිබේවී...
මරණ මංචකයේ සිටින සිරකරුවකුට කිව්වා ඔහුගේ අවසන් ඉල්ලීම කරන ලෙස,
විදුලි පුටුවේ ඔහුගේ මරණයට පෙර ඔහු ඉල්ලා සිටියා පෑනකුයි කොළයකුයි...
(ඔහුගේ සටහන මෙසේ යි)

මගෙ ආදරණීය අම්මේ...
නීතිය සාධාරණ නම්, මේ වෙනකොට ඔයත් මෙතන ඉන්න ඕනෙ,
මගෙ ළඟ වාඩිවෙලා මරණ දණ්ඩනය බලාපොරොත්තුවෙන්.
නමුත් නීතිය අන්ධ නිසා, අපි දෙන්න ම වග කිව යුතු වරදකට මම තනියෙන් වරදකරු වෙලා.
අම්මේ, මතකයි ද ඔයාගේ පුතා මම, අවුරුදු තුනේ දී,
හොරෙන් ගත්ත මගේ සහෝදරයගෙ රසකැවිලි?
මම අසල්වැසියෙකුගෙ සෙල්ලම් බඩුව ගෙදර නෑ කියලා
ඔවුන්ට පැවසුවා මට මතකයි වයස අවුරුදු 5 දී
අම්මෙ... මම අවුරුදු 12 දී, මම හැංගුවා මගේ ඥාතියාගේ පන්දුව ගරාජයේ...
ඒත් එදත් අම්ම කිව්වේ ඒක දැකලත් නෑ කියලයි ඔවුන්ට
ඔයාට මතකද මම අවුරුදු 15 දී මාව
ඉස්කෝලෙන් එළවපු දවස? තාත්තට ඕනෙ වුණා මට දඬුවම් කරන්න,
ඒත් ඔබ ඒක ප්‍රතික්ෂේප කළා,
ඔබ එයත් එක්ක ලොකු රණ්ඩුවක් වූවා, ඒ ඔබට මාව බේරන්න ඕනෙ වූ නිසා...
එදත් අම්ම කීවේ, මම තරුණයි තාම කියල... ඒ නිසා කමක් නෑ කියල...
අම්මා මං වෙනුවෙන් උන්නා, අම්මා මං වැරදියි කියල දැනගත්ත වෙලාව ඒක නෙමෙයි.
අම්මා කීවේ, මම නිවැරදි යි කියලයි... ඒත් ඔයා දන්නවා මම (ඒ හැම වෙලේ ම) වැරදි යි කියල...
මට තවත් හොඳට මතකයි,
මම අවුරුදු 17 දී අම්මා දැනගෙනත් මම අසල්වැසියෙක්ගේ බයික් එකක් හොරකම් කරල
විකුණුවා කියලා අම්මා මොකුත් ම කිව්වේ නෑ. (ඒ වෙලාවෙත්) ඔයා මට ගොඩක් ආදරෙ නිසා..
ඔයා මාව හැදුවෙ නෑ... ඔයා එහෙම කරලා කරේ මාව නරක් කරපු එක යි...
අන්න එහෙමයි මේ ඔක්කොම පටන් අරන් අන්තිමේ හෙමින් හෙමින් ඇවිත් මේ විදියට
මගේ මරණ මංචකෙන් අවසන් වෙන්නේ අද මම ගොඩක් තරුණයි අම්මේ,
අද මට ඕනේ ඔයාගෙ ආදරය, ඔයාට අද දෙන්න පුළුවන් ද ඒක?
මේක කියවන වෙලාව වෙනකොට මම මිය ගිහින් ඇති...
ඉතින් ආයුබෝවන් අම්මේ ඔයාගේ ආදරණීය පුතා...
කෝටුවක් පාවිච්චි නො කරන, දරුවන්ට සැර නො කරන, ඒත් ආදරය පමණක් ම කරන,
වෙලාවට උගන්වන, සියලු ම දෙමාපියන් වෙත යි මේ...
ආදරය කරන්න ඔබගේ දරුවන්ට නමුත් ඔවුන්ව "හදන්නට" අමතක නො කරන්න.

උපුටා ගැනීමකි - සංජීවන් ගුණතිලක

# කුරුසිය පාමුල කාන්තාවෝ



ශුද්ධ බයිබලයේ උත්පත්ති කතාව අනුව දෙවියන් වහන්සේ විසින් මුලින් ම මවන ලද්දේ පුරුෂයෙකි. කාන්තාව මවන ලද්දේ දෙවනුව ය. ඒ පුරුෂයාගේ ඉළ ඇටයකිනි (උත්පත්ති 1:27, 2:22). මෙම පුවත විග්‍රහ කරන ඇතැම්හු කිතු දහම පුරුෂයා උතුම් කොටත් ගැහැනිය දෙවැනි කොටත් සලකන බවට ප්‍රලාපයක් ඉදිරිපත් කරති. එහෙත් උත්පත්ති කතාවේ ම 2:24 සඳහන් වන්නේ මිනිසා තම මව ද පියා ද අතහැර සිය භාර්යාවට බැඳෙන බවත් ඔවුන් එක් කෙනකු වන බවත් ය. මේ නිසා ස්ත්‍රී පුරුෂ සමානත්වය කිතු දහම එකහෙළා අනුමත කරන්නකි. ජේසු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය, මරණය හා උත්ථානය ගැන කතා කරන විට ද කාන්තාව පිරිමියාට කිසි ලෙසකින්වත් දෙවෙනි නො වන බව ද ඇය එම කාර්යයන්හි දී පෙරමුණ ගත් බව ද පෙනී යයි.

සමිඳාණන් මරණයට තීන්දු කිරීම පිණිස පිලාත් ආණ්ඩුකාරයා වෙත ඉදිරිපත් කළ අවස්ථාවෙහි දී ද උන් වහන්සේ බේරා ගැනීමට ඉදිරිපත් වූයේ කාන්තාවකි. මතෙව් ශුභාරංචියේ 27:19 අනුව ඒ කාන්තාව පිලාත් ආණ්ඩුකාරවරයාගේ ම භාර්යාව ය. "තවද ඔහු විනිශ්චයාසනයෙහි සිටිය දී ඔහුගේ භාර්යාව ඒ නිදොස් මනුෂ්‍යයාට කිසිවක් නො කරන්න" යි පිලාත්ට කියා යැවුවා ය. සමිඳාණන් නිදොස් අයකු බව තේරුම් ගත්තේ ද පිලාත්ගේ භාර්යාව ය.

උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගැසීම සඳහා රැගෙන යන විට පසුපස ගියේ ද කාන්තාවන් ම ය. "... උන් වහන්සේ නිසා හඬා වැලපෙන ස්ත්‍රීයන්ගෙන් ද යුක්ත වූ විශාල පිරිසක් උන් වහන්සේ පසුපස ගමන් ගත්හ" (ලූක් 23-27). ශුභාරංචිකරුවා මේ ස්ත්‍රීන් ජෙරුසලමේ ස්ත්‍රීන් යන පොදු නාමයකින් හඳුන්වා තිබේ.

කුරුසියෙහි ඇණ ගැසූ අවස්ථාවෙහි දී ද උන් වහන්සේට සමීපව සිටියෝ ද කාන්තාවෝ ය. "ජේසුස් වහන්සේගේ මෑණියෝ ද, මෑණියන්ගේ සහෝදරිය වූ ක්ලෙයෝපාස්ගේ භාර්යාව වූ මරියා ද, මග්දලායේ මරියා ද උන් වහන්සේගේ කුරුසිය ළඟ සිටියෝ ය" (ජොහාන් 19-25). සිය මෑණියන් තමන් ප්‍රේම කළ ශ්‍රාවක ජුවාම් වෙත මෑණියන් කොට සමිඳාණන් විසින් බාර දෙන ලද්දේ මෙහි දී ය.

ජේසුස් වහන්සේගේ අපවත් වීම ගැන සඳහන් කරන සුවිශේෂක මාක්තුමා එම ශෝකජනක අවස්ථාවේ දී "ස්ත්‍රීහු දුරින් බලා සිටියහ. ඔවුන් අතර ගලීලයේ සිටිය දී උන් වහන්සේ පිරිවරා ගොස් උපස්ථාන කළ මග්දලායේ මරියාත්, කුඩා ජාකොබ්ගේ ද, ජෝශප්ගේ ද මව වන මරියාත් උන් වහන්සේ සමග ජෙරුසලමට ආ බොහෝ කාන්තාවෝත් සිටියහ" (මාක් 15:40) යි සඳහන් කරයි. සුවිශේෂක ලූක්තුමා කිසිදු කාන්තාවකගේ නමක් සඳහන් නොකරමින් "ගලීලයේ සිට උන් වහන්සේ සමඟ ආ ස්ත්‍රීහු ඒ දේ නරඹමින් නුදුරින් සිටියහ" (ලූක් 23:49) යි පවසයි. මතෙව් තුමා "මග්දලායේ මරියා ද, ජාකොබ්ගේ සහ ජෝශප්ගේ මව වන මරියා ද සෙබදිගේ පුත්‍රයන්ගේ මව ද ඔවුන් අතර වූහ" යි පවසයි (මතෙව් 27:55).

මේ සියලු සිදුවීම් විග්‍රහ කර බලන විට දේව මාතාව හැරුණු විට ජේසු සමිඳාණන්ගේ දුක්ප්‍රාප්තිය, මරණය හා උත්ථානය පිළිබඳ ප්‍රබල සාක්ෂිකාරිය මග්දලායේ මරියා බව පෙනී යයි. එතුමිය අපෝස්තුලුවරයන්ගේත් අපෝස්තුලුවරිය ලෙස හඳුන්වන්නේ එබැවිනි. ජේසු සමිඳුන්ට අතිශයින් ම ප්‍රේම කළ, උන් වහන්සේ නිසා ම පාපී දිවිය අතහැර යහමඟ තෝරා ගත් මග්දලායේ මරියතුමියගේ මෙම පිවිතුරු දේව ප්‍රේමයට වැරදි අර්ථ කථන ලබාදෙමින් ඩෑන් බ්‍රවුන්ගේ ද 'ඩාවින්සි කෝඩ්' බඳු ග්‍රන්ථ පවා නිකුත් වූයේ ය. මුල දී පාපී දිවියක් ගත කළ අයකු නිවැරදි මාවතකට පිළිපන් පසුවත් වැරදි කෝණයකින්, පාට කණ්නාඩියක් තුළින් බැලීම සාධාරණ නොවේ. සුවිශේෂකවරුන් සිව්දෙනා ම එතුමිය සමිඳුන්ගේ අවසාන සිදුවීම්වල අඛණ්ඩ සාක්ෂිකාරිය වූ බව පැහැදිලි කර තිබේ. උන් වහන්සේ කුරුසියෙහි උකුත් වනු දුටු එතුමිය උන් වහන්සේගේ ශ්‍රී ශරීරය තැන්පත් කළ තැන ද දුටුවා ය.

19 වන පිටුවට .....

කැලිස්ටස් ජයමාන්න

ශක්ති
ප්‍රබෝධනය

# මවකගේ මෙහෙයවීම ( කෙටි කතාව )



"පුතා, ඉක්මනට සූදානම් වෙන්නකෝ. අද මඟුල් ගෙදර යන්න තියෙනව. පුතාට මතකයි නේ ද? දානියෙල් මාමා ගෙදරට ම ඇවිල්ල කියලයි ගියෙ".

"මම යන්න ම ඕනෙ ද අම්මෙ? මට හරියට වැඩ තියෙනව".

"එහෙම හොඳ නැනෙ පුතේ? ඔයාගෙ යාළුවන්ටත් කියල තියෙනව. මම හිතන්නෙ එයාල දැන් ගිහිල්ලත් ඇති".

"අනේ මන්දා මම තාම වැඩ පටන් ගත්තෙත් නැහැ. මඟුල් ගෙදර ගියොත් අද දවස ම ඉවරයි".

"යමු යමු පුතා, ඔයාගෙ වැඩ කටයුතු මඟුල් ගෙදර ගිහින් ම පටන් ගනිමු. ඒක හොඳයිනෙ. ඔයාගෙ වැඩවලදී මම ඔයා ළඟින්ම ඉන්නවනෙ".

"හා හා එහෙනම් යමුකො. මම සූදානම් වෙලා එන්නම්කො. අම්ම නම් ලෑස්ති වෙලා ඉවරයි වගේ" කියමින් පුතා කාමරයට වැදුණේ ය. මඳ වේලාවකින් ඔහු සූදානම් වී පැමිණියේ ය.

"ෂා! පුතාගෙ ලස්සන! පුතත් එක්ක මෙහෙම එක පෙළට යනකොට මට හරි ආඩම්බර යි පුතේ".

"අම්මත් අද හරි ලස්සන යි. මේ ලෝකෙ ලස්සන ම අම්ම ඉන්නෙ මට තමයි. ඒත් අම්මෙ, මම යන පාරෙ මාත් එක්ක හැම තැන ම අම්මට එන්න බැරි වෙයි".

"බලමුකො, පුතාට මාව ඕනෙ වෙන්නෙ කොයි මොහොතෙ ද, මම එතැන ඉන්නව පුතේ" මෙසේ ළයාන්විත අල්ලාප සල්ලාපයෙන් මවත් පුතත් විවාහ මංගල්‍යය පැවැත්වෙන නිවසට පැමිණියෝ ය.

"අම්මෙ බලන්නකො; මුළු රටට ම මඟුල් කියල වගේ නේ ද? සෑහෙන සෙනඟක් ඉන්නවනෙ".

"ඔව් ඔව් ජයට ම මංගල්‍ය කටයුතු කරන බව ආරංචි උණා. දානියෙල් මාමා ඉතිං බිස්නස් කාරයනෙ. වයින් වෙළෙඳාම තමා එයාගෙ ප්‍රධාන ම ආදායම. ඉතිං කාසි හිඟයක් නැහැ. හැබැයි පුතේ; කිසි ම ආඩම්බරයක් නැහැ. හැමෝ ම එක්ක හොඳට කතා බහ කරනව".

"අම්ම ඉතිං ඇතුළට යන්න. අම්මගෙ යාළුවො ඇතුළෙනෙ ඉන්නෙ. මම එළියෙන් ඉන්නම්. මම දැක්ක මගේ කණ්ඩායම එළියෙ ඉන්නව".

"හොඳ යි, හොඳ යි, පුතේ" කියමින් මවත් පුතාත් දෙපසට ගියහ. සංගීතයත් නැටුමත් සමග ඉතා උත්කර්ෂවත් ලෙස මංගල කටයුතු කෙරීගෙන ගියේ ය. අලංකාර ධජ පතාක එසවී, දැල් වූ පහන් කණු ද තැන තැන එස වී, මුළු වත්ත ම අලංකාර වී තිබුණි. අලංකාර සැරසිලි ද ඊට නො දෙවෙනි ව තිබුණි. මිහිපිට සුර පුරයක් මෙන් ඒ මංගල ගෙමිදුල දිස් විය.

තරුණ පිරිස කෑම බීමවලින් අමුත්තන්ට සංග්‍රහ සත්කාර කළෝ ය. වෛවාරන කෑම බීමවලින් බන්දේසි පිරී තිබුණි. අමුත්තන්ට ඉතා ම ඉහළින් සංග්‍රහ සත්කාර කළෝ ය. තරුණ තරුණියෝ එකිනෙකා හඳුනා ගනිමින් විහිළු තහළු කරමින් සන්තෝෂ වූහ. ඔවුහු කෑම බීමෙන් නොව සංගීතයේ තාලයට නැටීමෙන් බොහෝ විනෝද වූහ.

නිවසේ ඇතුළු කොටස, වැඩිහිටි කාන්තාවන්ගේ රස කතාවලින් ද, සිනහවෙන් ද පිරී ගියේ ය. ඔවුහු එකිනෙකා පරයන ඇඳුම් ආයිත්තම්වලින් ද සැරසී, තමුන්ගේ වග විස්තර කතා කරමින් ද, කමින් බොමින් ද විනෝද වූහ. කලකට පසු ව හමු වූ නෑදෑ පිරිසට මෙන් ම යහළු මිත්‍රාදීන්ට ද කතා බහ කිරීමට බොහෝ දේ තිබුණි. ඔවුන්ගේ ශබ්දය සංගීත නාදය

පරදවමින් නැගී ආවේ ය.

ගෙහිමි කාන්තාව එනම් මනාලයාගේ මව ඉතාමත් උද්දාමයෙන්, කඩිසර ගමනින් එහා මෙහා යයි. සැම දෙනා සමග ම වචනයක් දෙකක් හෝ කතා කරයි. සංග්‍රහයේ අඩු පාඩු පිරවීමට උපදෙස් දෙයි. මෙසේ ටික වේලාවක් ගත වෙද්දී; භෝජනාගාර සේවකයෙක් පැමිණ ඇගේ කනට කර යම් දෙයක් පැවසී ය. ඇය වහා ම භෝජනාගාරය දෙසට ගියා ය.

"ඇයි, ඇයි, මොකද වෙලා තියෙන්නෙ?"

"වයින් ඉවරයි නෝනා. අන්තිම වයින් ටික තමයි දැන් බෝතල්වලට ගත්තෙ. බිම් මහලෙ වයින් ගබඩාවෙත් වයින් නැහැ. ඔක්කොම ඉවරයි. පුදුම සෙනඟක්නෙ ඉන්නෙ".

"දෙවියනේ වස ලජ්ජාවක් වෙන්නෙ. කාව හරි යවමු ද ටවුමෙ වයින් ගබඩාවට? එහෙ වයින් තියෙනව".

"ඒක හරියන්නෙ නැහැ. ටවුමට ගිහිං එන්න හෝරා දෙක තුනක් වත් යයි. නැද්ද ඉල්ල ගන්න කවුරුවත් මේ පැත්තෙ".

"මේ සෙනඟට සෑහෙන වයින් ඉල්ල ගන්න කෙනෙක් මේ අවට නැහැ. ඉන්නකො මම අපේ මහත්තයට කතා කරල බලන්න" කියමින් ඇය වහ වහා පිරිමි පක්ෂය සිටින දෙසට ගියා ය.

මේ කලබලය දැනුණ අපේ කතා නායිකාව හෙමිහිට ඒ දෙසට පැමිණියා ය. සිදු වී ඇති දේ ඇය දැන ගත්තා ය. ඕතොමෝ වහා ම තම පුතු සොයා ගියා ය.

"පුතා පොඩ්ඩක් මෙහාට එන්නකො."

"ඇයි ඇයි අම්මෙ?"

"පුතේ, මෙහෙ වයින් ඉවර වෙලානෙ. මේ බව අමුත්තො දැන ගත්තොත් මෙයාලට ලොකු අගෞරවයක් වෙන්නෙ. පුතාට බැරි ද මොනව හරි කරන්න?".

පුතා විස්මයෙන් තම මව දෙස බැලී ය.

"ඔය යි මම යි ඒ ගැන මොකට ද වද වෙන්නෙ? ආරාධිතයන්ට ඇති වෙන්න වයින් ගේන්න එයාල දැනගන්න ඕනෙනෙ? මේ තරම් විශාල සෙනඟකට වයින් පීප්ප දහයක් පහළොවක් වත් ලෑස්ති කරගන්න එපායැ. එයාල ඒ ගැන බලා ගනී. අම්ම වද වෙන්න එපා".

"පුතේ මඟුල් ගෙයක ප්‍රධාන ම දේ තමා වයින්. එයාල ප්‍රමාණවත් තරම් වයින් රැස් කරගන්න ඕනෙ තමයි. නමුත් පුතා කොහොම හරි ඒක අතපසු වෙලා තියෙනව. ඉතිං පුතාට අවස්ථාව ඇවිල්ල තියෙනව. දැන් වෙලාව හරි කියල මට හිතෙනව" කියමින් මව නැවත මෙහෙකරුවන් අසලට ගියා ය.

"ඔයාල කලබල වෙන්න එපා. මගේ පුතා දැන් එයි. එයා මොනව හරි කරයි. එයා කියන මොන දේ උනත් ඔයාල කරන්නකො" කියා ඇය නැවතත් මංගල ශාලාවට ගියා ය. හෙමින් හෙමින් එතනට පැමිණි පුතා දුටු මෙහෙකරුවෝ ඔහු දෙස දෑස් දල්වා බලා සිටියෝ ය. පුතා වට පිට බලද්දී පසෙක භාජන කිහිපයක් තිබෙනු දුටුවේ ය. ඒවා වතුර ලීටර් සියයක් පමණ අල්ලන ගල් භාජන යි.

"මේවාට වතුර පුරවන්න".

ඔහු අණ කළේ ය. සේවකයෝ මුහුණට මුහුණ බලා ගත්හ. නමුත්; දියේ ගසා ගෙන යන්නා පිදුරු ගසෙත් එල්ලෙන්නා සේ ඔවුහු වහ වහා වතුර පිරවූහ. ඔවුන්ගේ මුහුණු සමච්චල් සිනහවෙන් හැඩ වී තිබුණේ ය.

"වයින් කියල වතුර දෙන්න වගේ යන්නෙ?"

"කවුද බන් මේ හාදයා? ඥාතියෙක් ද?"

"ඔව්, ඔව්, ලොක්කගෙ ළඟ ම ඥාතියෙක්. මම ටිකක් දන්නව. වඩු වැඩ තමා කරන්නෙ".

"හරි හරි එහෙනම් කමක් නැහැ. අමුත්තො වයින් කියල වතුර බීල කැකෝ ගහන කොට අපිට ප්‍රශ්නයක් වෙන්නෙ නැහැනෙ".

"ඔව් ඔව් නැත්තම් අපිට පිස්සු කියල හිතයි. වයින් වෙනුවට වතුර බෙදනකොට" වැනි කවට වදන් කියමින් ඔවුහු වතුර පිරවූහ. එවිට එතැනට පැමිණි තරුණයා භාජන දෙස බලා දෑත් විදා, අහස දෙස බලා, දෑස් පියා නිශ්චල ව සිටියේ ය.

සේවකයෝ අන්ද මන්ද වී බලා සිටියෝ ය. මොහොතක් දෙකක් ගත විය. තරුණයා දෑස් විවර කර මෙහෙකරුවන් අමතා "හරි දැන් මේව උත්සව සංවිධායකට දෙන්න."

21 වන පිටුවට .....

ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න

# ශුද්ධවූ ජපමාලයේ හා කාර්මෙල් සළුධාතුවේ අසිරිමත් කතා පුවත




ශුද්ධවූ ජපමාලය හා කාර්මෙල් සළුධාතුව හා සබැඳි අතිශය වැදගත් කථා පුවත් පවතින අතර ඒවායේ එකිනෙකට බැඳී පවතින්නේ දේවමාතාවන්ගේ මැදිහත්කම් තුළින් අපේ විශ්වාසයේ ජීවිතය තහවුරු වන බවකි. දේව මාතාවන් විසින් ලොවට තිළිණ කළ ශුද්ධවූ ජපමාලය හා කාර්මෙල් සළුධාතුව තුළින් දේව ජනතාවට එදා මෙදා තුර ලැබී ඇති අසිරිමත් වරප්‍රසාද පිළිබඳව මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. ජපමාලය පිළිබඳව අප බොහෝ දෑ අසා ඇතත් කාර්මෙල් සළුධාතුව පිළිබඳව ඇති තතු සැදැහැවත් බොහෝ දෙනා නො දන්නා කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම යෙහෙකැයි හැඟේ.

කාර්මෙල් සළුධාතුව නොහොත් ජන වහරට අනුව කාර්මෙල් බෙන්තිඤ්ඤය දේව මාතාවන් විසින් ලොවට තිළිණ කරන ලද්දකි. ක්‍රි.ව. 1251 ජූලි මස 16 වන දින ශුද්ධවූ සයිමන් ස්ටොක් තුමාට වූ පොරොන්දුව මෙසේ ය. "කාර්මෙල් සළුධාතුව පැලඳ මිය යන තැනැත්තේ කිසි ම දිනෙක සදාකාලික නිරයට නොයනු ඇත." නිර්මල දේවමාතාවන් ශුද්ධවූ ඩොමිනික්තුමාට පැවසූ පරිදි යම් දිනක ශුද්ධවූ ජපමාලය හා කාර්මෙල් සළුධාතුව මගින් මම ලෝකය ගලවා ගන්නෙමි. ශුද්ධවූ ජුවාම් තුමාගේ සොහොයුරෙකු වන යෙපෙස්සියේ ෆ්‍රැන්සිස් හට සාතන් අනාවරණය කළ පරිදි තමන් හට මහත් පීඩාවක් වන්නේ පළමුව ජේසුස් යන ශ්‍රී නාමය යි. දෙවනුව මරිය යන ශ්‍රී නාමය සහ තුන්වෙනුව කාර්මෙල් සළුධාතුව වේ.

තවද අශුද්ධ ආත්මයන් කෑ මොර ගසා මෙසේ පැවසූ බවක් ද සඳහන් වෙයි. "ඔබ පැලඳ සිටින කාර්මෙල් සළුධාතුව ගලවා දමන්න. අපට අයිතිවන්නා වූ සෑම ආත්මයක් ම අපෙන් ඩැහැ ගන්නේ ඔය පලඳනාව යි ඔය පලඳනාව සමග මරණයට පත්වන සෑම කෙනෙක් ම ශුද්ධවත් මරණයක් ලබා අපෙන් මිදෙනු ඇත." මෙම කරුණු සළුධාතුවේ ඇති බලගතු බව පැහැදිලි වන්නේ ය. තවද පාතිමාවේ දී 1917 ඔක්තෝම්බර් 13 වන දින සූර්යයා තුළින් පිළිඹිබු කළ ප්‍රාතිහාර්යය සමග දර්ශනය වූ අවස්ථාවේ දෙව්මවුන් කාර්මෙල් සළුධාතුව ලොවට පෙන්වා සිටිය බව ද පැවසේ. මෙම සළුධාතුව නිරන්තරයෙන් පැලඳගෙන සිටීමත් අවම වශයෙන් ශුද්ධවූ ජපමාලයේ පන්ති පහක් දිනපතා ඔප්පු කිරීමත් දේව මාතාවන්ගේ බලාපොරොත්තුව වූ බව කියැවේ. මෙම කාර්මෙල් සළුධාතුව කොතරම් බලගතු දැයි කිවහොත් ක්‍රි.ව. 1280 සිට සෑම ශුද්ධෝත්තම පියතුමෙකු ම කාර්මෙල් සළුධාතුව පැලඳ සිටි බව සඳහන් වෙයි.

දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමාණන් තම ප්‍රථම නම වන කැරල් වොයිටිලා ලෙස කර්මාන්ත ශාලාවක තරුණ වයසේ දී රැකියාවක් කළ කාලයේ දී මෙම සළුධාතුව පැලඳගෙන සිටි බව ද සඳහන් ව ඇත. 1981 දී දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් වෙඩි පහරකට ලක් වූ පසු එතුමාව ශල්‍යකර්මයකට යොමු කළ අවස්ථාවේ දී එතුමන් පැලඳගෙන සිටි කාර්මෙල් සළුධාතුව ඉවත් නො කරන මෙන්, වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටි බව ද සඳහන් වෙයි.

12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් කාර්මෙල් සළුධාතුව පිළිබඳව මෙසේ පවසා ඇත. "ඔබ දේවමාතාවන්ගේ නිර්මල හෘදයට කැප වී සිටින බවට සාක්ෂියක් ලෙස කාර්මෙල් සළුධාතුව ජීවිත කාලය පුරා ම පැලඳ සිටින්න. විශේෂයෙන් ම අප ජීවත් වන මෙම විනාශකාරී කාලයේ දී මෙය අත්‍යවශ්‍ය පලඳනාවක් බවට පත්වනු ඇත."

ශ්‍රී ලාංකේය කතෝලික සැදැහැවත් ජනතාවගෙන් බහුතරයක් මෙම කාර්මෙල් සළුධාතුව පිළිබඳව එතරම් දැනුවත් වීමක් නැති බව අපට හැඟේ. එහෙත් ඉහතින් සඳහන් වූ කරුණු අනුව කාර්මෙල් සළුධාතුව නොහොත්

කාර්මෙල් බෙන්තිස්ඤ්ඤය අපගේ අවධානයට ලක්වීම වැදගත් බව පෙනී යයි. අප රටේ වැඩිහිටි පිරිසගෙන් මෙම සළුධාතුව පැලඳගෙන සිටින්නන්ගේ ප්‍රතිශතය ඉතා අල්පයක් වනු නො අනුමාන ය. එසේ වුව ද රෝගීන් හා දුෂ්ටාත්මයන්ගේ බලවේගවලින් දේව ජනතාව ගලවා ගැනීම සඳහා ආශ්වර්යවත් ලෙසින් සුව දානයේ යෙදෙන ගරු පියවරුන් දැන් දැන් මෙම සළුධාතුව ආශීර්වාද කර නිරතුරු පැලඳගෙන සිටීමට උපදෙස් දෙන බව අපි දනිමු. සමහරකු කාර්මෙල් බෙන්තිස්ඤ්ඤයක් පැලඳ සිටීමට ලජ්ජා වන බවක් ගම්‍ය වෙයි. එසේ වුව ද දේවමාතාවන් වන මරියෝත්තමාව ලොවට තිළිණ කළ මෙම කාර්මෙල් සළුධාතුව නොහොත් කාර්මෙල් බෙන්තිස්ඤ්ඤයක් ශුද්ධෝත්තම පියවරුන් පවා එදා මෙදා තුර පැලඳ සිටීමට ආශාව දැක් වූ බව උක්ත කරුණුවලින් පැහැදිලි වෙයි.

දරුවන් ප්‍රථම වතාවට දිව්‍ය භෝජනය ලබන දින දී කාර්මෙල් බෙන්තිස්ඤ්ඤය ආශීර්වාද කර පැලඳ ගැනීමට සැලැස්වෙන බව අපි දනිමු. ටික කාලයකින් එය පාවිච්චි කිරීමේ පුරුද්ද වියැකී යාමෙන් පසු නැවත පැලඳ ගැනීමේ ප්‍රවණතාවයක් නො දක්වන බව සාමාන්‍යයෙන් අප දකින දෙයකි.

මේ අනුව පූජාප්‍රසාදිවරයෙකු ආශීර්වාද කරන ලද කාර්මෙල් සළුධාතුවක් පැලඳ ගැනීමට ලොකු කුඩා කවුරුත් උනන්දුවීම වැදගත් බව ඉහත කරුණුවලින් අපට පැහැදිලි වෙයි. දේව මාතාවන්ගේ මැදිහත්කමින් ලොවට තිළිණ කළ ශුද්ධවූ ජපමාලය හා කාර්මෙල් සළුධාතුව ආශීර්වාද කරගෙන පැලඳ ගැනීමෙන් එතුමිය පොරොන්දු වූ පරිදි සදා නිරා ගින්නෙන් අප ගලවා ගනු ඇත. මෙය ලුහු කොට නො සැලකිය යුතු බව ලිපියේ මුලදී සඳහන් වූ කරුණුවලින් සාක්ෂ්‍යාත් වන්නේ ය. දේව මාතාවන් නිකරුණේ කිසිවක් ලොවට තිළිණ නො කරන බව අපි විශ්වාස කරමු. ශුද්ධවූ ජපමාලය හා කාර්මෙල් සළුධාතුව යන ශුද්ධවූ මෙවලම් ද්විත්වය ගැන ම වැඩි වැඩියෙන් නැඹුරු වීමට කාලය එළැඹ ඇතැයි අපට හැඟේ. අප රටේ පවතින සමාජ රැල්ලෙන් අප නිරා ගින්නට ඇදගන්නට වළකින සාතන්ට එරෙහිව කටයුතු කිරීම සඳහා කාර්මෙල් සළුධාතුව පැලඳ ගැනීමට අපි උනන්දු වෙමු.

මරියෝත්තමාව ශුද්ධවූ ජපමාලය හා කාර්මෙල් සළුධාතුව පරිහරණය කරන ලෙස කළ ඉල්ලීම් පිළිබඳව අපි ධනාත්මක චින්තනයක් ඇතිව කටයුතු කරමු. මරියෝත්තමාවෙනි, ඔබ වහන්සේ ලොවට තිළිණ කළ මෙම දෑ මගින් අප නිරා ගින්න වෙත ඇදීයාමේ ප්‍රවණතාවෙන් අත් මිදුව මැනව.

මරියෝත්තමාව අප දේව ජනතාවගේ මැදිහත්කාරිය වන්නී ය. එතුමියට ගෞරව දැක්වීමත් ලෙස සලකා ශුද්ධවූ ජපමාලය බැති සිතින් උච්චාරණය කරමු. එසේ ම කාර්මෙල් සළුධාතුව නිරතුරු පැලඳ ගෙන සිටිමු. එය මරියෝත්තමාවට අප දක්වන ගෞරවයේ සංකේතයක් කර ගනිමු.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

කුරුසිය පාමුල කාන්තාවෝ
15 වන පිටුවෙන්.....

"මග්දලායේ මරියා ද, ජෝශප්ගේ මව වන මරියා ද උන්වහන්සේ තැන්පත් කළ ස්ථානය බලා ගත්හ" (මාක් 15:47). එහෙත් එතුමිය ඉන් සෑහීමට පත් නො වූවා ය. මාක් 16:1 අනුව සබත් දින ගෙවුණු පසුව මග්දලායේ මරියා ද, ජාකොබ්ගේ මව වන මරියා ද, ... ගොස් උන්වහන්සේ ආලේප කරනු පිණිස සුවඳ ද්‍රව්‍ය මිලට ගත්හ. ඔව්හු සතියේ පළමුවැනි දා පාන්දර හිරු උදා වූ විගස ම සොහොන් ගේ ළඟට ආහ. එහෙත් සොහොන් ගේ තුළ කිසිවෙක් නො වී ය. උන්වහන්සේගේ ශ්‍රාවක පිරිමි කිසිවෙකු එහි නො වූ බව ද සඳහන් කළ යුතු ම ය. එහෙත් මග්දලායේ මරියා ප්‍රමුඛ කාන්තාවෝ සිය වෑයම අත් නො හළහ. උන්වහන්සේ උත්ථානව එතුමියට දර්ශනය වූ සේක. මාක්තුමා 16:9 හි සඳහන් කරන ආකාරයට ජේසුස් වහන්සේ නැඟිට වදාළ කල උන්වහන්සේ විසින් යක්ෂයන් සත් දෙනෙකු දුරු කරනු ලැබූ මග්දලායේ මරියාට මුලින් ම දර්ශනය වූ සේක. ඇය හඬමින් වැලපෙමින් ගොස් එපවත් හිතවතුන්ට සැල කළ ද ඔව්හු එය විශ්වාස නො කළහ. ක්‍රිස්තු උත්ථානයේ පළමු සාක්ෂිකාරිය වූයේ මෙම අභීත කාන්තාව ය. එම පුවත සත්‍යක් ම බවට අවධාරණය කරමින් ප්‍රචලිත කළේ මෙම කුරුසිය පාමුල සිටි අභීත කාන්තාවම ය. එසේ නම් චතාරික - පාස්කු කතාවේ කාන්තා දායකත්වය අපි කෙසේ නම් අවතක්සේරු කරමු ද?

# දෙවියන් වෙනුවෙන් සැබෑ විශ්වාසයක් කරා පියනඟමු



ත්‍රිත්වික දෙවියන් වහන්සේ තුළ පවතින අපේ විශ්වාසය මත ශුද්ධ වූ සභාව ගොඩනැඟී, සංවර්ධනය වෙමින් පවතී. ශුද්ධ වූ සභාව නම්, කිතුනු ජීවිතවල එකමුතුව යි. ශුද්ධ වූ පේදුරුතුමන් විසින් පෙන්තකොස්ත දිනයේ දී ආරම්භ කරන ලද මුල් කිතුනු සභාවේ සිට අද දක්වා ම එම දූත කාර්යය නියමාකාරයෙන් ඉෂ්ට කරමින් "කතෝලිකත්වය" විශ්වීය බවට පත් වූයේ අපි සතු වූ ගැඹුරු විශ්වාසය, ඇදහිල්ල නිසාවෙනි.

එලෙස පැරැන්නන් සතු වූ අතිමහත් ගැඹුරු එම කිතුනු ගුණාංග වර්තමාන නව පරපුර තුළ දක්නට ලැබෙනුයේ අඩුවෙන් බව කනගාටුවෙන් වුව ද, පිළිගත යුතු සත්‍යයකි. "නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය" (ජොහාන් 20:29) ජේසුස් වහන්සේ තම අපෝස්තුලුවර තෝමස් හට පැවසූ සේක. ඒ මොහොතේ ම තෝමස් අපෝස්තුලුවරයා තම අඳුරු ඇදහිල්ල අතහැර දෙවිඳුන් කෙරෙහි ප්‍රබල ලෙස විශ්වාසය තැබූහ. ආදම් සහ ඒව හේතුවෙන් මිනිස් සංහතියට හිමි වූ ජන්ම පාපය, මෙලොවින් තුරන් කරන බවට දෙවියන් වහන්සේ විසින් වූ පොරොන්දුව ජේසු සමිඳුන්ගේ උත්ථාන වීම තුළ සඵල විය. මෙය වඩාත් පැහැදිලි වන්නේ, උන්වහන්සේ උත්ථානයෙන් දින පනහකට පසු පැවැත් වූ "පනහ" හෙවත් පෙන්තකොස්ත මංගල්‍යය දින, ජෙරුසලම් චතුරස්‍රයේ සිට පේදුරු තුමන් විසින් කළ දේශනයට පසු, තුන් දහසක පමණ ජනයා මනස්ථාපව බෞතීස්ම ලැබීමෙනි (ක්‍රියා 10:1-8, 44-48). ශුද්ධාත්ම වරමින් පූර්ණ වූ අපි ද ශක්තිමත් කිතුනු දිවියකට ඇතුළු වී ඇත්තෙමු.

අපගේ මුතුන්මිත්තන් විසින් පාරම්පරිකව ගෙන ආ ධර්මදූත කාර්යය ඉදිරියට ගෙන යාමේ වගකීම පවතිනුයේ වර්තමාන වැඩිහිටි, තරුණ අප අතේ ය. මෙය අප අතින් නිසි ලෙස සිදු වනවාදැයි යන පැනය මා තුළ නිතොරව පැන නඟී. සත්‍ය නො සඟවා පැවසුවහොත්, අපේ මුතුන් මිත්තන් අප හට දායාද කළ එම ගැඹුරු ජීවිත අත්දැකීම අපි අතින් අනාගත පරපුරට ගෙන යාමේ අඩු ප්‍රවණතාවක් පවතී.

දරුවන් ලෙස පාසල් සමයේ දී අපි විවිධ ආගමික කටයුතු සඳහා භක්තියෙන් සහභාගී වෙමු. සැරසිලි කටයුතු, සංවිධාන කටයුතු යනාදිය කැප වී සිදු කරමු. එහෙත් වැඩිහිටි වියට පැමිණි පසු, ජීවිතයේ ඇති වගකීම් රාශිය, හෝ සමාජ තරගකාරීත්වය හෝ අවිවේකී බව හෝ මොනයම් පෞද්ගලික කරුණක් හෝ අපිව ආගමික කටයුතුවලින් ඈත්වීමකට ලක් කරයි. මේ නිසා, අපි නො දැනුවත්ව ම ආධ්‍යාත්මික පිබිදීම අත්හැර ලෞකික වස්තූන්, සැප සම්පත්, පමණක් පසුපස හඹා යමින් සිටිමු.

මේ හේතුවෙන් දෙවියන් හා අප අතර ඇති සබඳතාව පළුදු වෙමින් පවතී. අපගේ ම දරුවන්ට ද, ළමා පරපුරට ද අපි මුතුන්මිත්තන් විසින් අපට ලබා දුන් ඒ ගැඹුරු විශ්වාසය, කිතුනු දායකත්වය, නායකත්වය හා කැපවීම අප තුළින් ගිලිහී යමින් පවතී.

ජේසුස් වහනසේ ශුද්ධ වූ සභාවේ හිස වන සේක. ප්‍රසාද ස්නාපනය ලැබූ අපි ජේසුස් වහන්සේගේ පරම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ අවයවයෝ වම්හ. කුමන හෝ අවයවයක් ශරීරයෙන් වෙන් වුවහොත් සබඳතාව බිඳී ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය විකෘති වේ. අංගවිකල වේ (I කොරින්ති 12:13). මේ වචන තුළ, අපි දෙවියන් වහන්සේගේ මැවිල්ල බැවින් මිනිසා දෙවියන්ට ඍජුවම සම්බන්ධ වී ඇත. එබැවින් එම බැඳීම තවදුරටත් ශක්තිමත් නො වන්නේ නම්, කතෝලික සභාව තුළ පවතින ජීවමාන එකමුතුකම විසිරී යන බව යි.

එහෙයින්, මඳක් සිතන්න. හදවතට එකඟව කල්පනාවේ යෙදෙන්න. අප මේ යන ගමන නිවැරදි ද? එසේ නම් අප කළ යුත්තේ කුමක් ද? අප මූලිකත්වය ලබාදිය යුත්තේ කුමක් සඳහා ද? ක්‍රිස්තු දේහය සමග ඇති සබඳතාව පළුදු කර නො ගෙන, ඒ සමග වඩාත් ඍජු, ඒකාත්මික සබඳතාවක් ගොඩනඟා ගැනීමට, නිරතුරු යාච්ඤාවේ යෙදෙමු.

**මාක් ජයමාන්න**
**සාන්ත ආනා විද්‍යාලය,**
**කුරුණෑගල.**

මවකගේ මැදිහත්වීම (කෙටි කතාව) 17 වන පිටුවෙන්.....

"ඊට පස්සෙ අමුත්තන්ට සංග්‍රහ කරන්න" කියා එතනින් නික්ම ගියේ ය. මේ මහා පුදුමය දෙස විස්මයෙන් බලා සිටි සේවකයෝ සිහි එළවා ගත් විගස වයින් වීදුරුවක් රැගෙන සංවිධායක ව සොයා ගෙන ගියහ. කිසිත් නො කියූ සේවකයෝ වයින් වීදුරුව ඔහුට පෑවෝ ය. ඔහු එය රැගෙන බිඳක් තොල ගෑවේ ය. තලු මැරුවේ ය. තව ටිකක් බිව්වේ ය. හොඳ හැටි රස බලා මුළු වීදුරුව ම හිස් කළේ ය.

ඔහු කඩිනමින් මනාලය සොයා ගියේ ය.

"මොකද මේ මෙහෙම වැඩ කරන්නෙ? වෙන මිනිස්සු හොඳ වයින් මුලින්ම දීල; මිනිස්සු පදමට බිව්වට පස්සෙ බාල ඒව දෙනව. ඔයාල හොඳ ඒව හංගල, මුලින් බාල වයින් දීල, දැන් හොඳ වයින් දෙනව නේ ද?" කියා කේන්තියෙන් කෑ ගැසී ය. මනාලයා උඩ බිම බැලුවේ ය. ඔහුට කිසිත් තේරුම් ගැනීමට නොහැකි විය.

"ඇයි ඇයි මොකද උණේ? අපි හොඳ වයින් හැංගුවෙ නැහැ. හොඳ වයින් තමයි දුන්නෙ".

එවිට ම ඔහුගේ මව පැමිණියා ය. ඇය සිදුවීම දැන ගත්තා ය. ඇයත් වයින් ගෙන්වා ගෙන රස බැලුවා ය. ඔවුහු පුදුම වූහ. සේවකයන්ගෙන් සිදු වූ සිදුවීම විමසා දැනගත්හ. මනාලයාගේ මව සිදුවීමට අදාළ මව සහ පුතාව සෙවී ය. නමුත් ඔවුන්ට ඒ දෙදෙනාව සොයා ගැනීමට නො හැකි විය.

# ලස්සන ජීවිතයක්

කොල්ලා නම් ඉඳියි අපොයි මේකිව ලෙව කාගෙන
මහ ගැනිත් එක්ක ඉන්න ලෙහෙසි නොවෙයි එපමණ
අපි දෙන්නා බව දැනගෙන අතින්'ත ගන්නට යන
කියා තිබුණි නැන්ද කෙනෙක් වදනක් හිත පෑරෙන

මෙමම බඳින්නේ කොල්ලාව යි මහ ගෑනිව නොවේ
නැන්දා හට ඇය ගාණක් නැති ලෙසට ලු පැවසුවේ
නැන්දම්මල ඒ වැනි කොයි තරමට හිටියත් ලොවේ
මගේ මැණියන් ඇය හට දුවකට මෙනි සැලකුවේ

සිසි නෝනෝ සිසි නෝනෝ කියමින් ඇය පසුපස
සිටියා මිස නැත විරසක වුණේ මවා ගෙන මිස
ඇයද මගේ අම්මා හට ඇයගේ මව හට ලෙස
ආදරය කරන අයුරු දුටු විට පිරුණි තොස

මංගල යෝජනාවලට වැල නොකැඩී පැමිණිය
මගේ පියාගේ හොඳ හැටි දුටුවෙමි බව හිත ගිය
ඉන් බේරා ගත්තේ මා ආදර අම්මා ම ය
වෙනස් කර දුනි මා හට තාත්තගේ හිත ඇය

අම්මා ලොව හැරයන්නට කලින් රත්තරං බඩු
දුන්නේ මෙම දියණියට යි සියල්ල නොමැතිව අඩු
ගත කළ මුළු දිවිය පුරාවට ආදරය ම වැඩු
දෙදෙනාගෙන් කිසිවකු කීවේ නැත මා හට නඩු

ආදරවන්තියගේ පිය සඳු සමුගත් දා සිට
ඔහුගේ හොඳ නම වැදගත්කම රැකගෙන සැම විට
අගහිඟකම් මැද මතුවන නො සැලී දිවි සටනට
උරදුන් හැටි කීව ම මව කැමැත්ත දුනි ඇය හට

එයට වන්දි ගෙවන්න මෙන් ඉටු කොට සැම මෙහෙවර
මවන ලදී නිවහන තුළ සුව දෙන විමනක් සුර
ඇය මට තව මවක විය හමු වූ පිනකින් පෙර
හිමිව තිබුණි ඥානය පිය සඳුගෙන් බඳු මහ මෙර

මංගල ගමනට පළමුව අම්මා ඇය හට ඇගේ
දුන් බව ඔවදනක් කීය යුග දිවියට ඇති අගේ
එය අනෙකක් නොවේ දිවිය මුළු ලස්සන කළ මගේ
අම්මා හට කරන්න යැයි ආදරය මට වගේ

පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව

# TWISTED WISDOM IN MODERN SOCIETY

Whether everyone in this world wants to be wise is a question mark. Whether everyone is gifted with the mental capacity to acquire wisdom is still controversial. The first issue under consideration is what wisdom is. Should wisdom conform to a definition? Or do proverbs such as 'humility is the beginning of wisdom' provide any hint to understand wisdom? Generally the ability to make sensible decisions and good advice because of the experience and knowledge is wisdom. What did King Solomon request? According to 1 King 3:5-9, 'Give thy servant therefore an understanding mind to govern thy people that I may discern between good and evil; for who is able to govern this thy great people?'

King Solomon's request makes us aware of the rudiments of wisdom. The one who is wise is able to distinguish good from evil, right from wrong. Nowadays, it is reiterated by the educated that modern man is lost in a wilderness of mirrors. This can be interpreted in a number of ways. Modern man encounters an overwhelming amount of information and disinformation making it difficult to find reliable information and discern truth from falsehood. Deception and manipulation of information to achieve selfish ends can be observed in every sphere of life. Reality is distorted to such an extent that discerning truth has almost become impossible. As a result, a lack of clear direction prevails in every society at present and people's lives are becoming increasingly complex and chaotic.

Yet, the pathetic situation in the modern world is that it is folly to be wise where ignorance is bliss. It seems that modern man has become imbecile to such an extent that he thinks ignorance is not only bliss but also wisdom. All social media is cleverly manipulating thinking patterns and life styles of people. It is not surprising innocent children become victims of man-created ignorance. The worst for any society is the way that the so called educated twist and manipulate the truth. As a devout Catholic, I am astonished to find that Sri Lankan government is still unable to find the truth regarding Easter Sunday Bomb Attack and bring to law those who are responsible. Where is our wisdom, who has stolen it? When the law has failed to implement justice, the future of the people is in jeopardy.

It is always wise to recall and remind Marcus Cicero's amazing study of society in 43 B.C. The poor work and work, the rich exploit the poor, the soldier protects both, the taxpayer pays for all three, the banker robs all four, the lawyer misleads all five, the doctor bills all six, the goons scare all seven and the politician lives happily on account of all eight. Our society hasn't changed much since then. Only addition is that politicians have absolute power that they can commit any heinous crime, manipulate law and escape from punishment which is phrased as smart politics. The ancient wisdom is such that different trades are essential to cater to the needs and sustainable function of any society. However, it is sad that people think it is an honor to do a profession. One writer said that he didn't want to do business that exploits consumers, didn't want to become a banker who lives on the interest paid by people and didn't want to become a lawyer who lives on the problems of people. He questions

what honor is there when you live on the interest, problems and exploited profits.

The modern trend is that all professions have deviated from the noble purpose of service. All professionals search every opportunity to maximize income and never pause a moment and think why he exists. Moreover, they have well-organized associations to safeguard and perpetrate their selfish aims and they are untouchable. Hospitals keep not only patients but also dead bodies longer with machines to charge more. Companies change expiry date of products and resell in order to double income. It has never been proved online Tech-Education with Smart Boards achieves intended learning outcomes. Developed countries like Sweden researched on this and now they have gone back to book and pencil again. Interactions with a teacher produce good children. Interactions with a machine produce robots-like-children who haven't sympathy or empathy. Yet, in Sri Lanka both parents and children are hoodwinked by massive guerilla marketing to promote online learning, a money-spinner. It is an utter failure just like massive tuition widely spread throughout Sri Lanka. The biggest fallacy of education is in tuition and online learning, "I have taught therefore, students have learnt." In the status quo like this, isn't it folly to be wise? The wise think what cannot be cured has to be endured.

In a discussion of wisdom, it is important to refer to a graffiti inscribed by an ancient sage who said that wisdom is a process. He points out at least four decades should precede before reaching the decade of wisdom. Once a child is born, the first decade is the decade of dependence. Then he enjoys the decade of all types of games and sports. After, the decade of colors in prime youth. The fourth decade is called the decade of power. According to him, man reaches the decade of wisdom approximately at the age of 41. Leaving out its shortcomings, it is a fair transformational process to help children acquire a state of wisdom. In this context, experience plays a crucial role in anyone's life to become a wiser person.

Moreover, there are a number of characteristics that mark a wise person. Predominantly, the wise man knows what is right and morally rewarding. He never engages or supports any evil and lives according to the motto 'Live and let live'. His very existence is not a threat to the environment and his fellow human beings. He speaks only when it requires and refrains from hurting and condemning others. Although he sets his own moral principles, they are never detrimental to the well-being of any society. Wisdom is not usually associated with academic success and a high level of IQ. The wise man is not mentally adamant and respects the views of others. Most of all he knows the limits of his knowledge and is fully aware of the impermanence of three P's: Possessions, Pleasures and Power. In conclusion, if humility is the beginning of wisdom, let me quote Isaac Newton, "I do not know what I may appear to the world, but to myself I seem to have been only like a child playing on the sea-shore, and diverting myself in now and then finding a smoother pebble or a prettier shell than ordinary, whilst the great ocean of truth lay all undiscovered before me."

**K. C. Grero**
Senior Lecturer, Former Oblate Scholastic

# ඕං එහෙනං



රටක් වට කර වැට බැන්ඳත් බොල කට වටකර වැට බඳිනු බොරු
නමක් නැති කර ලොව දිනුවත් බොල දිනුමක් කිසිදා ලැබෙනු බොරු
යමක් නැති කර සැප ලැබුවත් බොල දුක මිස සැප කිසි දා ලැබෙනු බොරු
පිනක් නිති කර අප රැකුණොත් බොල අපායේ දොර නම් ඇරෙනු බොරු

කළු ගණනින් කිරි පොවලා හැදුවත් හපා කෑම අත නොහරින්නා
බලු වලිගය උණ පුරුකයේ දැම්මත් දිග නොහැරෙන සේ වන්නා
සයුරක දිය ගෙන පිටට වත් කළත් නො රැඳෙන තාරාවන් සේ වන්නා
ලස්සන ලෝකය කැත කර දමනා මිනිසුන් කුමකට උපදින්නා

ජනතා කර මත සබයට එන්නා සබකෝලය නැත දොඩවන්නා
බල්ලට බත් ටික කොල්ලට දං කොඩ දිය කර බඩ කට පිම්බෙන්නා
ජරාව කාලා ජරාවේ නැගලා ජන්මෙට වැඩියෙන් පුරුදු වෙනා
මෙහෙමත් මිනිසුන් කොයි වළ යන්න ද කියලා සිතෙද්දී දුක හිතෙනා

මිනිසත් බව ලැබ මිනිසුන් අතරට මිනිස් වෙසින් ආ මිනිසුන්නේ
කොටි වලසුන් මෙන් මිනිසුන් නසන්ට උගුල් අටවනා මිනිසුන්නේ
තම කම නසාන මනුදම් වඩාන සොයුරන් සේ ඉමු මිනිසුන්නේ
ලස්සන ලෝකය ලස්සන වන්නට දිරි දෙමු නිති අපි මිනිසුන්නේ

හැමදා ඉන්නට වරම් අපට නැත කවදා හරි චුත විය යුත්තේ
ජනබල ධනබල ජනගල කොතෙකුත් ඇතිමුත් වෙලාව ආ කල යා යුත්තේ
සොබාව දහමට පිටුපා ඉන්නට බැරි බව සිහියට ගත යුත්තේ
මනු බව ලද අප මිනිසුන් විලසින් ඉන්නට සිහියේ තබා ගත යුත්තේ

## ශඥාන පාතෙනි

නැණ නුවණින් පිරි කුසලානයකි ඔබ සුවඳැති ආදර සුදු අම්මේ
කඩු පහරින් හද සිදුරු වුවත් ඔබ ජේසුට ඉන්නා අපෙ අම්මේ
ඔබ සතුටින් විඳ දරාගෙන ම සැම දිවි ගෙව්වා ජේසුගේ අම්මේ
මනු ලොව සග මග එක්කළ පාලම ඔබ ම යි අපෙ අම්මේ

ජේසන් ඔයස් - සූරිය

# ගැහැනු පූජක වේයි ද මන් දා....




"සොඳුරු මල නුඹ" යැයි කියූ විට
මලක් නොව මං නටුව කියනා
"සඳක් මෙන් ඔබ" යැයි කියූ විට
තෙදැති හිරු මේ මමයි කියනා


කවදාම හරි කියන දවසක
ලොව්ම දිනන්නට බලන් සිටිනා
මිනිස්සුන් බොහොමයක් ඉන්නේ
හැදිමිටේ නුවණමයි සොයනා

ජීවිතේ බොහොමයක් තැන්වල
"ගෑනු ගෑනුම තමයි" කියනා
ගැහැනු දිය ඇලි වගේ නම් නොව
මහා පර්වත ලෙසම දිලෙනා

ලොවම රැඩිකල් වෙලා තිබුණත්
ගැහැනු පූජක වේයිද මන්දා
අරලියා මල් නිතර දැක්කත්
මැයි මාර මල් කොහෙත් තිබුණා

චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම ........



# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



ආදර දුවේ පුතේ,


අද මම ඔයාලට කියන්න හදන්නෙ පුංචි වික්‍රමයක් නම් නෙවෙයි. අම්මා කෙනෙකුගෙ විශාල වික්‍රමයක්. ඇත්තට ම ඒ අම්මා මේ වික්‍රමය කරන්නෙ තමන්ගෙ දරුවා වෙනුවෙන් විතරක් නෙමෙයි. තවත් දරුවන් රැසක් වෙනුවෙන්. මේ කතාවෙ තියෙන විශේෂත්වය ඒක යි.

ඔන්න දවසක් දා අම්මට ඉස්කෝලෙන් පණිවිඩයක් ලැබෙනවා. ''ඔයාගෙ දරුවට කලන්තෙ කැරකිල්ල වගේ. කල්පනාවත් අඩුයි. ඉක්මනින් ඉස්කෝලෙට එන්න.'' ඒ වගේ පණිවිඩයක් ලැබුණ ම කවුරුත් බය වෙනවනේ. අම්මයි, තාත්තයි ඉක්මනින් ම ඉස්කෝලෙට ගියා. පුතා හිටියෙ අම්මා, තාත්තවත් අඳුනගන්න බැරි විදියට. දරුවව රෝහලකට අරන් යනවා. රෝහලෙන් කියන්නෙ ආහාර අජීර්ණයක් වෙන්න පුළුවන් කියලා. ඒත් අම්ම දන්නවා අජීර්ණයක් වෙන්න දෙයක් ගෙදරින් නම් නො ලැබුණු බව. සවස් වෙන කොට පුතාට තරමක් හොඳ යි. අම්මා අහනවා පුතාගෙන් ''මොනවද කෑවෙ'' කියලා. විශේෂ දෙයක් පුතාට මතක් වෙන්නෙ නෑ. දිගින් දිගට ම හිතද්දි එයා කියනවා ''යාළුවෙක් ටොෆියක් දුන්නා අම්මෙ. ඒක කෑවට පස්සෙ නිදිමත ගතියක් දැනුණා'' කියලා.

එදා රෑ පුරා ම අම්මට නින්දක් නෑ. තාත්තා රෝහලේ පුතා ළඟ. ඒ පාසල අවට ප්‍රදේශයත් ඒ තරමම හොඳ පරිසරයක් නෙවෙයි. නීති විරෝධී වැඩත් සිදු වෙන බව අම්මා දන්නවා. අම්මා පහුවදා උදේ රෝහලට යද්දි දරුවට සුවයි. රෝහලෙන් පිටවෙන්න පුළුවන් බවට වෛද්‍යවරයා නිර්දේශ කරලා. ඒත් අම්මා තීරණය කරනවා ආයෙමත් වෛද්‍යවරයා එක්ක කතා කරන්න. එයාගෙ හිතේ සැකය ගැන කියනවා. ආයෙමත් පරීක්ෂණයක් කරන්න කියල ඉල්ලා සිටිනවා. ඔන්න ගෙදර එන්න හිටිය පුතාව ආයෙමත් වාට්ටුවට ඇතුළත් කරනවා. පර්යේෂණ කරනවා. ඒ පර්යේෂණයෙදි පැහැදිලි වෙනවා පුතාගෙ සිරුරට මත්ද්‍රව්‍යයක් ඇතුළත් වෙලා තියෙන බව. ''යාළුවා දුන්න ටොෆිය'' මත්ද්‍රව්‍යයක් විය හැකි බව එයාල තීරණය කරනවා.


අම්මා වහා ම එන්නෙ පාසලට. විදුහල්පතිතුමාවත් දැනුවත් කරලා පාසලට ටොෆි ගෙනාපු දරුවා එක්ක කතා කරනවා. පාසල් දරුවන් ඉලක්ක කරගෙන ප්‍රදේශයේ පැතිර යන මත්ද්‍රව්‍ය ව්‍යාපාරයක් ගැන තොරතුරු හෙළි කරගන්න ඔවුන්ට හැකි වෙනවා. පොලිසියත් දැනුවත් කරල අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අම්මා වෙහෙස වෙනවා. ඇයට තර්ජනවලටත් මුහුණ දෙන්න සිදු වෙනවා. කොටින් ම පවුලේ අය පවා කියන්නෙ 'තමන්ගෙ දරුවා හදා ගන්න. අනවශ්‍ය කරදරවල පැටලෙන්න එපා' කියලා. නමුත් මේ අම්මා කිව්වෙ 'මගෙ දරුවා විතරක් බේරිලා මදි' කියලා. සමාජයක් ම අයහපතට ඇදෙද්දි තමන්ගෙ දරුවාව විතරක් ආරක්ෂා කර ගෙන ජීවත් වෙන්න අමාරු බව වටහා ගන්න තරම් ඒ අම්මා ප්‍රඥාවන්ත යි.

ඉතින් පාසලත් එක්ක එකතු වෙලා පාසල ඇතුළට මත්ද්‍රව්‍ය එන එක නවත්වන්න මේ අම්මාට හැකි වෙනවා. ඒත් දුවේ, පුතේ... මේ රටේ හැම තැනකට ම දැන් මත්ද්‍රව්‍ය උවදුර පැතිරිලා ඉවර යි. ඒක ටොෆියක්, චොක්ලට් පෙත්තක් වගේ රස කැවිල්ලක් විදියටත් ඔයාල ළඟට එන්න පුළුවන්. යාළුවන් එක්ක මේ වගේ දේවල් අත්හදා බලන්න යන්න එපා. මත්ද්‍රව්‍ය කියන්නෙ පුංචි ඔයාලව ඉක්මනින් ම වසඟ කර ගෙන ඔයාලගෙ ජීවිතය විනාශ කරන රකුසෙක්. ඒ නිසා හැමවිටම කල්පනාවෙන් ඉන්න. ඒ වගේ ම මේ කතාව ඔයාලගෙ මව්පියන් එක්ක බෙදාගන්නත් අමතක කරන්න එපා.




**තරු නැන්දා**

# ප්‍රහේලිකා අංක - 85



**පහළට**

1. දිව්‍ය පූජාවේ දේව වචනය අලළා පියතුමා සිදු කරන කතාව.
2. භාවනාවෙහි යෙදීම.
3. කුසලානය යන්නට සමාන පදයකි.
4. දුනුවායා.
6. නියෝගයක් සඳහා උසාවියෙන් කරන ඉල්ලීම.
7. ලූල්කඳුර, වන්ඩාවල ඇල්ල පිහිටි මධ්‍යම පළාතේ නගරය
8. මුල් බිම.
9. ගෙයක වටේට හා කාමර වෙන් කිරීමට ගඩොල් ආදියෙන් බඳින බැම්ම.
13. පසුගිය දා දරුණු භූමිකම්පාවකට මුහුණ දුන් රට.
14. දේව මාතාවන් වෙනුවෙන් කැප කළ වාසය.
16. පඳුරු වශයෙන් වැඩෙන ශාකයක්. දුර්ලභ යි. වාත රෝග සඳහා ප්‍රකට ඖෂධයකි. නාග විෂට අගනා බෙහෙතකි.
18. ධන අයනය.
20. "මුඛය".
22. "අම්මා" සමාන වචනයකි.
25. "සුදුසු".

**හරහට**

1. දේව පුත්‍රයා බිහි කළ මව.
3. යම්කිසි තරංග ආයාමයක කිරණ සම්පූර්ණයෙන් උරා ගැනෙන නැතහොත් විනිවිද නො පෙනෙන යන්නෙහි අර්ථය.
5. ගාබ්‍රියෙල් දේව දූතයා දේව මාතාවන් ආමන්ත්‍රණය කළ නාමය.
9. ඉන්දියාවේ බුදු දහම හා සම්බන්ධ ප්‍රාන්තය.
10. "කීර්තිය".
11. ලෝකය, පොළොව යන්නට සමාන අරුත් දේ.
12. අඳුර, කළුවර යන්නට සමාන ය.
15. බෙල්ලේ දෙපසින් පිහිටි නහර දෙක.
17. හිස නැති මළ කඳ.
19. කුඩා ළමයින්ට උච්චාරණය පුහුණු කළ පැරණි පොතක්.
21. තෘණ වර්ගයක නමක්.
23. එක් වරකට කටට ගන්නා ආහාර ප්‍රමාණය.
24. රථ රෝදයකට සවි කරන රබර් පට්ටම.
26. කුඹුරේ වැඩි ජලය ගලා යෑමට නියර කපා තනා ගන්නා කපොල්ල.
27. "ඇඳ".

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා,**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය,
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2025 මැයි 31** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 85**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 83 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ආ | 2 සි | යා | ව | | 3 ජූ | 4 දා | ආ | 5 ග | ම |
| 6 ජ | ය | | | 7 ස | ව | න | | ම | |
| න් | | 8 ආ | 9 ර | | 10 කී | ය | ද | | 11 වි |
| 12 ටි | න් | මා | ළු | | නු | | | | ශ් |
| නා | | ශ | | | 13 මු | 14 හු | 15 ද | | වා |
| 16 ව | ර | ය | | 17 මු | නි | ව | ත | | ස |
| | | | | | තු | | | 18 ලී | ය |
| 19 හි | ව | 20 ලා | | 21 සෝ | මා | 22 ලි | යා | ව | |
| න් | | වා | | | | දි | | 23 ර | 24 තු |
| 25 දු | ම | | 26 ක්‍රි | ස් | ති | යා | නි | | ලා |

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමග
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email:bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 83 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 83 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - පියොද් තෂ්මික ගමගේ, 8 ශ්‍රේණිය, ද මැසිනොද් විදුහල, කඳාන.
- **දෙවන ස්ථානය** - මාටිනා පෙරේරා, 9 ශ්‍රේණිය, සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07.
- **තෙවන ස්ථානය** - මිහේලි දෙවන්සා නානායක්කාර, 10 ශ්‍රේණිය, සා. බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2025 ජූලි / අගෝස්තු - "වන්දනා ගමනකි"**
(ජූලි - අගෝස්තු කලාපය සඳහා ඔබ එවන ලිපි මැයි 15ට පෙර අප වෙත එවන්න.)
**2025 සැප්තැම්බර් / ඔක්තෝබර් - "අපේ ජ්‍යෙෂ්ඨයෝ"**
(සැප්තැම්බර් - ඔක්තෝබර් කලාපය සඳහා ඔබ එවන ලිපි ජූලි 15ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025

■ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

1. 1. ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස හඳුන්වනු ලබන පොත නම් කරන්න.
   2. ශු. පාවුළුතුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
   3. ශුද්ධ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘති දෙක නම් කරන්න.
   4. සංකේත භාවිතයේ පරමාර්ථ දෙකක් ලියන්න.
   5. ක්‍රි.ව. 80-96 අතර කාලයේ කිතුනුවන්ට දරුණු පීඩා කළ රෝම අධිරාජ්‍යයා කවුරු ද ?
   6. 7 සහ 12 යන සංඛ්‍යා සංකේතවල අර්ථය ලියන්න.
   7. ගිබියොන්හි පූජාසනය මත දවන යාග පූජා දහසක් පුද කළ රජතුමා කවුරු ද ?
   8. අභිධාර්මික ප්‍රඥාව සඳහා පුරාණ ගිවිසුමේ ලියා ඇති ග්‍රන්ථ 2ක් නම් කරන්න.
   9. පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාළ නීති නියෝග පිළිබඳව සඳහන් ග්‍රන්ථය නම් කරන්න.
   10. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

2. 1. පංච පුස්තකය සකස් වී ඇත්තේ කුමක් පදනම් කරගෙන ද ?
   2. පංච පුස්තකයට අයත් පොත් 3ක් නම් කරන්න.
   3. පංච පුස්තකය තුළ අඩංගු වී ඇති කරුණු 5ක් ලියා දක්වන්න.

3. 1. ඉශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න.
   2. දිවැසි වැකි කීමේ දී භාවිතා කළ තුන් ආකාරය පද මාලාව කුමක් ද ?
   3. අද සමාජය තුළ කිතුනු සිසුවකු ලෙස ඔබගේ දිවැසිවර වගකීම ගැන කරුණු 5කින් විස්තර කරන්න.

4. 1. සෙනග විනිශ්චය කරන පිණිස හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඉල්ලා යාච්ඤා කළ රජතුමා කවුරු ද ?
   2. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද 3ක් නම් කරන්න.
   3. ඔබේ ජීවිතයේ ප්‍රඥාවන්තව කටයුතු කළ හැකි අවස්ථා 5ක් නම් කරන්න.

5. 1. ද්වීතීයික ශු. පාවුලු සංදේශ 2 නම් කරන්න.
   2. නව ගිවිසුමේ වෙනත් සංදේශ ලියූ අපෝස්තුළුවරුන් තුන් දෙනෙක් නම් කරන්න.
   3. ශුද්ධවූ පාවුළු තුමා කිතුනු සංඝ බැහැදැකීමට නොහැකිව ලිපි ලියා අවධාරණය කිරීමට බලාපොරොත්තු වූ කරුණු කිහිපයක් දක්වන්න.

## පිළිතුරු

1. 1. ක්‍රියා පොත.
   2. කාර්යය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ අපහසුව / සිරගතව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නො හැකියාව.
   3. පුරාණ ගිවිසුමෙහි - දානියෙල්ගේ පොත / නව ගිවිසුමෙහි - එළිදරව්ව පොත.
   4. සංකේතවලින් ගැබ්ව ඇති තොරතුරු වටහා ගැනීමට සතුරන්ට නො හැකි වීම / විරුද්ධවාදීන්ට එය තේරුම්ගත නො හැකි වීම / යහපත් අයගේ ආරක්ෂාව සැලසීම.
   5. ඩොමීෂියන් අධිරාජ්‍යයා. 6. 7 - පූර්ණත්වය. 12 - ඉශ්‍රායෙලය / දේව ජනතාව.
   7. සලමොන් රජතුමා. 8. ජෝබ් සහ ධර්මදේශකයා. 9. ලෙවී ව්‍යවස්ථාව.
   10. නීතිය / ව්‍යවස්ථාවලිය / මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව.

2. 1. පරම්පරාගත විශ්වාස සහ අත්දැකීම් මත.
   2. උත්පත්ති පොත / නික්මයාම / ලෙවී ව්‍යවස්ථාව / ගණන් කතාව / ද්වීතීය නීති සංග්‍රහය.
   3. විශ්වයේ ආරම්භය / මිනිසා මවනු ලැබීම, මිනිසා පාපයට වැටීම / දෙවියන් වහන්සේ ආදි පියවරුන් තෝරා ගැනීම / ඉශ්‍රායෙල්වරුන් ඊජිප්තුවේ වහල්භාවයට පත්වීම / මෝසෙස්තුමාගේ නායකත්වය යටතේ ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට යාම.

3. 1. දේශක දිවැසිවරු / ලේඛක දිවැසිවර.
   2. "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක" / "මෙසේ වදාරන්නේ සමිඳාණන් වන මම ය" / "සමිඳාණන් වහන්සේගේ පණිවිඩය .......... වෙත පැමිණියේ ය.
   3. සිසු අදහස්.

4. 1. සලමොන් රජතුමා.
   2. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව / රාජ්‍ය සභා ප්‍රඥාව / අභිධාර්මික ප්‍රඥාව / එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව.
   3. යහළුවකුට කරදරයක් වූ විට / ජීවිත අභියෝග පැමිණි විට / තරගවලින් ජයග්‍රහණයක් ලැබූ විට / තරගවලට මුහුණ දෙන විට / විභාගවලට මුහුණ දෙන විට.


5. 1. එපීස / කොලොස්සි.
   2. ජාකොබ්තුමා / පේදුරුතුමා / ජොහාන්තුමා / ජූද්තුමා.
   3. ඔවුන්ගේ විශ්වාසය ස්ථිර කිරීම / අවවාද අනුශාසනා දීම / කිතුනු සංඝවල ඇතිවන ගැටළු නිරාකරණය කිරීම / දේව ධාර්මික හා එඩේරික උපදෙස් ලබා දීම.

**ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම IX

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## සමදර්ශක ශුභාරංචි



සුවිශේෂක කතුවරුන් සිව් දෙනා පිළිබඳව පසුගිය කලාප මඟින් හඳුන්වා දීමක් කර ඇත. මෙම කලාපය තුළින් බලාපොරොත්තු වන්නේ සමදර්ශක ශුභාරංචි ගොඩනැඟීම පිළිබඳව ය.

<u>සමදර්ශක ශුභාරංචි යනු කුමක් ද?</u>

සමදර්ශක ශුභාරංචි සම්පාදනය වීම සම්බන්ධව ශු. ලූක් සුපුවතේ සංක්ෂිප්ත වාර්තාවක් ඇත. එනම් "ශ්‍රීමත් තියෝපිලස් තුමෙනි, අප අතර ඉටු වී ඇති සිද්ධීන් අලළා කථා වස්තුවක් සම්පාදනය කිරීමට බොහෝ දෙනකු උත්සාහ කර ඇත. ඔවුන් එසේ කර ඇත්තේ ඒ සිද්ධීන් මුල සිටම සියැසින් දුටු අය හා දහම් පණිවුඩය දෙසූ අය අපට බාර දුන් කරුණු අනුව ය. එබැවින් මුල සිට ම සියල්ල තතු පරිදි විමසා බැලූ මට ද ඔබ උදෙසා විධිමත් වෘත්තාන්තයක් ලිවීම මැනව යි සිතිනි" (ලූක් 1:1-3).

ඉහත ගැළපුමින් පෙන්වා දෙන්නේ සුවිශේෂයේ සඳහන් වෘත්තාන්තය රචනා කරන්නට ඇත්තේ එක් අයකු නො වන බව ය. ඒ අනුව සමදර්ශක ශුභාරංචි ගොඩනැඟීමට කරුණු 3ක් බලපා ඇත.

1. ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියා පිළිබඳව ඇසූ දුටු අයගෙන් කරුණු ලබාගෙන ඇත.
2. ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් පසුව ශුභාරංචිය දේශනා කළ අයගෙන් කරුණු ලබාගෙන ඇත.
3. ශුභාරංචිය රචනා කළ කතුවරයාගේ නිදහස් චින්තනය, දැක්ම හෝ දෘෂ්ටිකෝණය බලපා ඇත.

සමදර්ශක ශුභාරංචි රචනා කර ඇත්තේ ශුද්ධවර ලූක්, ශුද්ධවර මාක් සහ ශුද්ධවර මතෙව් යන රචනා කරුවන් ය. ශුද්ධවර ජොහාන් සමදර්ශක සුපුවත් අතරට අයත් වන්නේ නැත. එහිදී එම කතුවරුන්,

1. එක ම දර්ශනය හා රටාවක් ද,
2. අන්තර්ගත තොරතුරු එක ම සැලැස්මක් යටතේ ද,
3. භාෂා රචනා ශෛලිය එක සමාන වීම ද

හේතුවෙන් එම ශුභාරංචි සමදර්ශක ලෙස හැඳින්වේ. ඔවුන්ගේ පොදු අරමුණ වී ඇත්තේ මාංශගත වූ ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයා බවත්, මනුෂ්‍ය පුත්‍රයා බවත් තහවුරු කිරීම ය. එම නිසා ක්‍රිස්තුස් වහන්සේගේ උපත, ළමා කාලය, ප්‍රසිද්ධ ජීවිතය, දුක් විඳීම හා මරණය, උත්ථානය සුපුවතේ කේන්ද්‍රය වී ඇත. එම ශුභාරංචි මඟින් පෙන්වා දීමට උත්සාහ දරන්නේ ජේසුස් වහන්සේ සියලු ක්‍රියාකාරකම් දිළිඳුන්ට, කාන්තාවන්ට, රෝගීන්ට සහ සමාජය ප්‍රතික්ෂේප කළ කොන්වූ අය කෙරෙහි යොමු වූ බව ය.

<u>සමදර්ශක සුබාරංචි සම්බන්ධව විවිධ මත</u>

එම ශුභාරංචි අධ්‍යනාය කිරීමේ දී ඇතැම් කරුණු ශුභාරංචි තුනේ ම සටහන් වී ඇත. තවත් කරුණු ශුභාරංචි දෙකක පමණක් සටහන් වී ඇති අතර, අනෙක් ශුභාරංචියේ සටහන් වී නැත. තවත් ඇතැම් කරුණු එක් ශුභාරංචියකට පමණක් සීමා වී ඇත. එම නිසා මේ පිළිබඳව ශුද්ධ ලියවිලි විශාරදයන් විසින් විවිධ මත 5ක් පෙන්වා දී ඇත.

**1. මුඛ පරම්පරාගත ව පවතින කථා පුවත්**

ක්‍රිස්තු ශාසනය ආරම්භ වීමත් සමග අපෝස්තුළුවරුන් කළ දේශනා එලෙස දේශනා කිරීමට හේතු, ප්‍රාදේශිය ව්‍යවහාරයන් අරාමීය හා ග්‍රීක් බසින් යම් යම් අය රචනා කරන්නට ඇත. පසුව ඒවා ශුභාරංචි 3ක් ලෙස ගොඩනැගී ඇතැයි එක් විශාරද මතයකි.

**2. මතෙව් පොත ප්‍රථමයෙන් ම රචනා වූ බවට මතයකි.**

එම විශාරද මතය ගෙන එන්නේ මතෙව් පොත මුලින් ම රචනා වී ඇති ලිඛිත ශුභාරංචිය බවත්, එය අත්පොත වශයෙන් භාවිත වූ බවත් ය. පසුව මතෙව්තුමා එම අත්පොතේ ඇතුළත් තොරතුරු, ක්‍රිස්තුස් වහන්සේගේ දේශනා අරාමීය බසින් රචනා කොට පසුව පරිවර්තනය කර ශුභාරංචියක් ලෙස නිර්මාණය වූ බව තවත් විශාරද මතයකි.

**3. මාර්ක් ශුභාරංචිය ප්‍රථමයෙන් රචනා වූ බවට ඇති මතය**

ක්‍රි. ව. 65-70 අතර කාලයේ මාර්ක් සුපුවත රචනා වී ඇති බවත් එය මූලාශ්‍ර කරගෙන "අපෝස්තලික අත් පොත" ලෙස පසුව රචනා වී එය මාර්ක් ශුභාරංචිය ලෙස පිළිගැනීමට ලක් වී ඇති බව තවත් විශාරද මතයකි.

**4. ද්වි ලේඛන උපන්‍යාසය**

එම මතය ක්‍රි. ව. 1833 දි ජේ. හුවයිස් විසින් ඉදිරිපත් කළ අතර එච්. ජේ. හෝල්ස්මන් විසින් ද එය තහවුරු කරන ලදී. ඔවුන් පෙන්වා දෙන්නේ මාර්ක් ශුභාරංචිය සමග ජර්මන් බසින් පෙන්වා දෙන Quelle (ක්විලේ - උල්පත), Q මූලාශ්‍රය යන මූලාශ්‍රයන් දෙක ම ලූක් හා මතෙව් ශුභාරංචි රචනා කිරීමට භාවිත කර ඇති බව ය. Q මූලාශ්‍රය යනු ක්‍රි. ව. 55ට පෙර ජනශ්‍රැතියේ ගොඩනැගී ඇති "ක්‍රිස්තු පුවත්" වේ. එම මූලාශ්‍රය ලිඛිත මෙන් ම වාචික ද විය හැක. ලූක් හා මතෙව් යන දෙදෙනා එක් මූලාශ්‍රයක් ලෙස මාර්ක් ශුභාරංචිය ද අනෙක Q මූලාශ්‍රය ද භාවිත කරමින් ක්‍රි.ව. 80-90 අතර කාලයේ ලූක් ශුභාරංචි පොත ද, ක්‍රි.ව. 80-100 අතර කාලයේ මතෙව් ශුභාරංචි පොත ද රචනා වී ඇති බවට තවත් විශාරද මතයකි.

**5. චතුර්විධ ලේඛන මූලාශ්‍ර උපන්‍යාසය**

එම මතය ඉදිරිපත් කරන විශාරදයින් පෙන්වා දෙන්නේ මුලින් ම රචනා කළ ශුභාරංචිය වූ මාර්ක් පොතෙන් ද ක්‍රි.ව. 55ට පෙර වූ Q (ක්‍යු) මූලාශ්‍රය ද මතෙව්ට හා ලූක්ට ආවේණික වූ කරුණු ද එක් කොට මතෙව් හා ලූක් පොත් රචනා වී ඇති බව ය. මතෙව්තුමාට ආවේණික මූලාශ්‍රය M ලෙස හා ලූක්තුමාට ආවේණික මූලාශ්‍රය L ලෙස පෙන්වා දිය හැක. ඒ අනුව මතෙව් ශුභාරංචිය සඳහා මාර්ක් පොත + Q (ක්‍යු) මූලාශ්‍රය + M මූලාශ්‍රය උපයෝගි කරගෙන මතෙව් පොත ලිය වී ඇත. එසේ ම ලූක් ශුභාරංචිය සඳහා මාර්ක් පොත + Q (ක්‍යු) මූලාශ්‍රය + L මූලාශ්‍රය උපයෝගි කරගෙන ලූක් පොත ලියැවී ඇත.

මේ අනුව පැවසිය හැක්කේ මාර්ක් ශුභාරංචිය සෙසු පොත්වලට වඩා ප්‍රථමයෙන් සම්පාදනය වී ඇති බවකි. එයට හේතු කිහිපයක් පෙන්වා දිය හැක.

1. මාර්ක් පොතට ඇත්තේ පරිච්ඡේද 16කි. එම මුල් ලේඛනය සංක්ෂිප්ත ස්වභාවයක් ගන්නා බැවින් පරිච්ඡේද සංඛ්‍යාව අඩු ය.
2. ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් තරමක් රළු ස්වභාවයකින් ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් ශුභාරංචි යම් මටසිළුටු බවක් පෙන්වා දේ.
3. මාර්ක් පොතේ වැඩි පරිච්ඡේද සංඛ්‍යාවක් වෙන් කර ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සඳහා ය. එම නිසා මාර්ක් ශුභාරංචිය "දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය" ලෙස හැඳින් වේ.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**


TRANSWORLD GLS
CARRYING CARGO WITH CARE
A subsidiary of
TRANSWORLD GROUP SINGAPORE
Air Freight
Liner Agency
Supply Chain Solutions
Sea Freight
Inland Logistics
ISO Tanks
Projects
10 countries
36 offices
BLPL SINGAPORE
BLPL FAITH
BLPL
BEST COMPLIMENTS FROM
TRANSWORLD GLS (LANKA) PVT LTD
Ceylinco Houe, No 69. 8th Floor, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka T.P +94 11 7634170/77 FAX +94 11 2481020
OUR PRESENCE
SINGAPORE
VIETNAM
MALAYSIA
INDIA
MYANMAR
SRI LANKA
THAILAND
CHINA
INDONESIA
AFRICA

BCI
Aspire to Inspire

# ඔබේ උපාධි සිහිනයට BCI සරසවිය
# After A-levels

## Management

- Bachelor of Business Management Honours
- BBM Hons in Accounting and Finance
- BBM Hons in Marketing Management
- BBM Hons in Human Resource Management
- Diploma in Business Management and Analysis
- Diploma in Human Resource Management

SRI LANKA . BCI . APPROVED BY THE MINISTRY OF EDUCATION
UGC RECOGNIZED



## Computing

- BSc Hons in Information Technology
- BSc Hons in Software Engineering

## Teaching

- BEd Hons in Primary Education
- BEd Hons in Early Childhood Education
- Higher Diploma in Primary Education
- Higher Diploma in Early Childhood Education

අධ්‍යාපන අමාත්‍යාංශය
විසින් අනුමත කරන ලද ගෞරව උපාධි

## Psychology

- BSc Hons in Counselling Psychology
- Diploma in Psychological Counselling
- Certificate in Counselling
- Certificate in Addiction Psychology and Substance Abuse

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

BCI Campus - Negombo

070 603 5100 www.bci.lk | edu@bci.lk

මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස්. එස්. ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/02/2025